# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

# 2024

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,
ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

**රනිල් වික්‍රමසිංහ**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

## වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

### 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තිය යටතේ ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් අදාළ වසරේ ජූනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වල යාවත්කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2024 වසරේ පළමු මාස හතර තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2024 පළමු මාස හතර සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# පටුන


පිටු අංකය

**01 වන පරිච්ඡේදය** **ආර්ථික සන්දර්භය**

1.1 සමාලෝචනය 1
1.2 උද්ධමනය 2
1.3 මුදල් හා ණය 3
1.4 කොටස් වෙළෙඳපොළ 3
1.5 විදේශ අංශයේ ප්‍රවණතා 4
1.6 ගෝලීය ආර්ථික ප්‍රවණතා 7

**02 වන පරිච්ඡේදය** **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා**

2.1 සමාලෝචනය 13
2.2 රාජ්‍ය ආදායම 15
2.3 රාජ්‍ය වියදම 26
2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය 32
2.5 රාජ්‍ය ණය කළමනාකරණය 33

**3 වන පරිච්ඡේදය** **රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය**

3.1 සමාලෝචනය 37
3.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය 37

**4 වන පරිච්ඡේදය** **විදේශ මූල්‍යයනය**

4.1 සමාලෝචනය 45
4.2 විදේශ මූල්‍යන එකඟතා 45
4.3 විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි හා උපයෝජන 45
4.4 එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය 47
4.5 විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය 48

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම 2023 | වටිනාකම 2024 (තාවකාලික) |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තුව | % | -10.7 | 5.3 |
| කෘෂිකර්මාන්ත | පළමු කාර්තුව | % | 1.6 | 1.1 |
| කර්මාන්ත | පළමු කාර්තුව | % | -24.3 | 11.8 |
| සේවා | පළමු කාර්තුව | % | -4.6 | 2.6 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) (CCPI, 2021=100) | මැයි අවසානයට | % | 25.2 | 0.9 |
| සේවා වියුක්ති අනුපාතය | වාර්ෂික | % | 4.7 | ලැ.නො. |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | වාර්ෂික | % | 48.6 | ලැ.නො. |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන.-අප්‍රේල් | රු.මිලි. | -824,256 | -361,101 |
| මුළු ආදායම ප්‍රදාන ද ඇතුළුව | ජන.-අප්‍රේල් | රු.මිලි. | 821,346 | 1,218,065 |
| බදු ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 742,578 | 1,117,762 |
| බදු නොවන ආදායම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 77,493 | 98,268 |
| මුළු වියදම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 1,645,602 | 1,579,166 |
| වර්තන වියදම | ජන.-අප්‍රේල් | රු.මිලි. | 1,484,984 | 1,419,264 |
| රාජ්‍ය ආයෝජන | ජන.-අප්‍රේල් | රු.මිලි. | 177,903 | 165,335 |
| රාජ්‍ය ණය | දෙසැ.අවසානයට | රු.බිලි. | 28,695.9 | ලැ.නො. |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,846 | 4,056 |
| එයින් කෘෂි අපනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 792 | 828 |
| කාර්මික අපනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,036 | 3,210 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,617 | 1,570 |
| වෙනත් | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,419 | 1,640 |
| ආනයන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 5,325 | 5,833 |
| පාරිභෝගික භාණ්ඩ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 949 | 1,059 |
| අන්තර් භාණ්ඩ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,601 | 3,779 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,635 | 1,530 |
| ආයෝජන භාණ්ඩ | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 770 | 991 |
| වෙළඳ ශේෂය | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -1,479 | -1,777 |
| සංචාරක පැමිණීම් | ජන.-මැයි | සංඛ්‍යාව | 524,486 | 896,779 |
| සංචාරක ඉපැයීම් | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 752 | 1,406 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | ජන.-මැයි | ඇ.ඩො.මිලි. | 2,347 | 2,624 |
| සමස්ථ ගෙවුම් ශේෂය | ජන.-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 883 | 1,288 |
| දළ නිල සංචිත | මැයි අවසානය | ඇ.ඩො.මිලි. | 3,491 | 5,421 |
| විනිමය අනුපාතය (මාසය අග) | මැයි අවසානය | ඇ.ඩොලරයට රුපියල් | 295.5 | 301.8 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | ජන.-මැයි | ඇ.ඩොලරයට රුපියල් | 310.2 | 299.7 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | මැයි අවසානය | % | 15.50 | 8.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | මැයි අවසානය | % | 16.50 | 9.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | මැයි අවසානය | % | 4.00 | 2.00 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය නව ණය පොළී අනුපාතය | අප්‍රේල් අවසානය | % | 23.09 | 12.67 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ණය පොළී අනුපාතය | අප්‍රේල් අවසානය | % | 17.87 | 13.14 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | අප්‍රේල් අවසානය | % | 25.74 | 9.61 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | අප්‍රේල් අවසානය | % | 23.00 | 9.99 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_2b$) | අප්‍රේල් 2024/ අප්‍රේල් 2023 | % | 3.7 | 8.3 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | අප්‍රේල් 2024/ අප්‍රේල් 2023 | % | -8.6 | 4.1 |

## ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| **විදුලි බලය** | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2016 | % | 99.3 |
| **ජලය** | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2023 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 97.3 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2023 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 61.6 |
| **මාර්ග** | | | |
| මාර්ග ඝනත්වය | 2023 | වර්ග කි.මී. | 0.19 |
| මාර්ග වල මුළු දිග | 2023 | කි.මී | 1 44,967 |
| **සන්නිවේදනය** | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2023 | පුද්ගලයින් 100 කට | 137.0 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | 2023 | පුද්ගලයින් 100 කට | 103.8 |
| **අධ්‍යාපනය** | | | |
| **පොදු අධ්‍යාපනය** | | | |
| ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය | 2023 | % | 85.1 |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්) | 2023 | සංඛ්‍යාව | 16.8 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2021 | % | 93.3 |
| පරිගණක සාක්ෂරතා අනුපාතය | 2023 | % | 39.5 |
| **විශ්ව විද්‍යාල අධ්‍යාපනය** | | | |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය | 2023 | සංඛ්‍යාව | 22.5 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 18-22) [අ] | 2023 | % | 9.9 |
| **සෞඛ්‍ය** | | | |
| රෝහල් | 2023 | සංඛ්‍යාව | 619 |
| ඇඳන් | 2023 | සංඛ්‍යාව | 89,786 |
| රෝහල් ඇඳන් | 2023 | පුද්ගලයින් 1,000 කට | 4.1 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2023 | සංඛ්‍යාව | 985 |
| **ජනගහනය** | | | |
| ජනගහන ඝනත්වය | 2023 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 351 |
| ජනගහන වර්ධනය | 2023 | % | -0.6 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2017 | අවුරුදු | 75.5 |
| ළදරු මරණ අනුපාතිකය | 2019 | සජීවී උපත් 1,000 කට | 7.4 |
| මාතෘ මරණ අනුපාතිකය | 2022 | සජීවී උපත් 1,000 කට | 22.6 |
| දළ උපත් අනුපාතිකය | 2023 | පුද්ගලයින් 1,000 කට | 11.2 |
| දළ මරණ අනුපාතිකය | 2023 | පුද්ගලයින් 1,000 කට | 8.2 |
| යැපුම් අනුපාතිකය | 2023 | % | 49.4 |
| **දරිද්‍රතාව** | | | |
| දරිද්‍රතා දර්ශකය | 2019 | % | 14.3 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය | 2019 | සංගුණකය | 0.46 |
| දරිද්‍රතා පරතර දර්ශකය | 2019 | % | 2.8 |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | 2019 | කිලෝකැලරි | 2,120 |
| **ජාත්‍යන්තර ශ්‍රේණි ගත කිරීම්** | | | ස්ථානය |
| මානව සංවර්ධන දර්ශකය | 2022 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 78 |
| ව්‍යාපාර පවත්වා ගෙන යාමේ දර්ශකය | 2020 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 99 |
| ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | 2019 | රටවල් 141 ක් අතරින් ස්ථානය | 84 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2023 | රටවල් 184 ක් අතරින් ස්ථානය | 149 |
| ගෝලීය සාම දර්ශකය | 2024 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 100 |
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2022 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 95 |

*(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ.*

# 1 වන පරිච්ඡේදය

# ආර්ථික සන්දර්භය

## 1.1 සමාලෝචනය

නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ ඇති වූ පෙර නොවූ විරූ දරුණුතම ආර්ථික අර්බුදයෙන් අනතුරුව, රජය විසින් ක්‍රියාත්මක කරන ලද ස්ථාවර හා අඛණ්ඩ ප්‍රතිපත්ති ගැලපුම් හේතුවෙන් 2023 වසරේ දෙවන භාගයේ දී පිළිබිඹු වූ ආර්ථික පුනර්ජීවනය, 2024 වසරේ පළමු කාර්තුවේ දී තවදුරටත් ශක්තිමත් විය. නොකඩවා කාර්තු හයක් මුළුල්ලේ ආර්ථිකය සංකෝචනය වීමෙන් අනතුරුව, 2023 වසරේ තෙවන කාර්තුවේ සිට අඛණ්ඩව කාර්තු තුනක දී ආර්ථික වර්ධනයක් වාර්තා කිරීම මගින් ආර්ථිකය තිරසර ලෙස යථා තත්ත්වයට පත්වීමේ මාවතකට අවතීර්ණය වී ඇත. 2023 වසරේ පළමු මාස පහ තුළ උද්ධමනය තනි ඉලක්කමක මට්ටමක පවත්වා ගැනීම, ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම, සංචාරක ඉපැයීම් හා ශ්‍රමික ප්‍රේෂණ වර්ධනය වීම හේතුවෙන් විදේශ අංශයේ කාර්යසාධනය වැඩිදියුණු වීම, මුදල් ඒකකය සමස්තයක් ලෙස අතිප්‍රමාණය වීම හා දළ නිල සංචිත ප්‍රමාණය වර්ධනය වීම මගින් ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු වේ.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, 2023 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කරන ලද සියයට 10.7 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.3 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් වී ඇත. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ධනාත්මක ලකුණු මනාව පිළිබිඹු කරමින්, 2024 වසරේ පළමු කාර්තුවේ දී කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා යන ආර්ථිකයේ සියළුම අංශයන් වර්ධනය විය. 2024 වසරේ පළමුවන කාර්තුව තුළ දී වර්තා කරන ලද කෘෂිකාර්මික අංශයේ සියයට 1.1 ක වර්ධනය සඳහා ධාන්‍ය වගාව, මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීව වගාව හා සත්ත්ව නිෂ්පාදන අංශයන්ගේ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කර්මාන්ත අංශය 2023 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කරන ලද සියයට 24.3 ක සංකෝචනයට සාපේක්ෂව, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.8 කින් වර්ධනය විය. ඉදිකිරීම් කර්මාන්ත, පතල් හා කැණීම් කර්මාන්තය හා නිෂ්පාදන කර්මාන්තයන්හි වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රධාන වශයෙන් නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් හා රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් යන ක්‍රියාකාරකම්වල වර්ධනය හේතුවෙන් සේවා අංශය 2023 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කරන ලද සියයට 4.6 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.6 කින් වර්ධනය විය.

2023 වසරේ ජූලි මාසයේ සිට උද්ධමනය තනි ඉලක්කමක මට්ටමක පැවතිණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., 2021=100) 2024 වසරේ ජනවාරි මාසයේ දී සියයට 6.4 සිට 2024 වසරේ මැයි මාසයේ දී සියයට 0.9 දක්වා අඩු විය. කෙසේ නමුත්, කො.පා.මි.ද. යේ (2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මූලික උද්ධමනය, 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 2.2 ක සිට 2024 වසරේ මැයි මාසයේ දී සියයට 3.5 ක් දක්වා වැඩි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 වසරේ මාර්තු මාසය අවසානයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 8.50 හා සියයට 9.50 දක්වා පදනම් අංක 50 කින් අඩු කරමින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කරන ලදී.

විදේශ අංශය 2024 වසරේ මුල් මාසවල දී ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. වෙළඳ භාණ්ඩ අපනයන 2023 වසරේ පළමු මාස හතර තුළ ඇ.ඩො. මිලියන 3,846.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 4,056.1 දක්වා සියයට 5.5 කින් වැඩි විය. වෙළඳ භාණ්ඩ ආනයන 2023 වසරේ පළමු මාස හතර තුළ ඇ.ඩො. මිලියන 5,325.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 5,833.2 දක්වා සියයට 9.5 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ ගිණුමේ හිඟය, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,479.0 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,777.1 ක් දක්වා පුළුල් විය.

සේවක ප්‍රේෂණ, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,867.2 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,079.9 ක් දක්වා සියයට 11.4 කින් වැඩි විය. සංචාරක ඉපැයීම්, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 652.2 ක සිට 2024 සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,251.6 ක් දක්වා සියයට 91.9 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. 2024 වසරේ පළමු මාස හතර තුළ අනෙකුත් සේවා අංශය වෙත වූ අනෙකුත් ලැබීම් වර්ධනය විය. විදේශ විනිමය ලැබීම් වර්ධනය වීමත් සමඟ 2024 වසරේ අප්‍රේල් මාසය අවසාන වන විට දළ නිල සංචිත ප්‍රමාණය චීනයේ මහජන බැංකුවෙන් ලද හුවමාරු පහසුකම ද ඇතුළුව ඇ.ඩො. බිලියන 5.5 ක් දක්වා වර්ධනය විය. විදේශ අංශයේ ධනාත්මක වර්ධනයන් හේතුවෙන් 2024 වසරේ මැයි මාසය අවසානය දක්වා එම වසර තුළ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල සියයට 7.3 කින් අතිප්‍රමාණය විය.

මාස 48 ක් තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ ඉහළ කාර්යසාධනය සැළකිල්ලට ගනිමින්, 2024

වසරේ හතරවන වගන්තිය (Article IV) යටතේ වන උපදේශනය හා වැඩසටහනේ දෙවන සමාලෝචනය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මෙරට ආර්ථික ප්‍රතිපත්ති හා ප්‍රතිසංස්කරණ සඳහා සහාය දක්වමින් 2024 වසරේ ජූනි මස 12 වන දින වැඩසටහනේ තුන්වන වාරිකය වශයෙන් විශේෂ ගැනුම් හිමිකම් මිලියන 254 ක් (ඇ.ඩො. මිලියන 336 පමණ) ඉතා කඩිනමින් නිදහස් කරන ලදී. ඒ අනුව, 2023 වසරේ මාර්තු මාසයේ වැඩසටහන ආරම්භයෙන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ දක්වා ඇ.ඩො. බිලියන 1 ඉක්මවා අරමුදල් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා අවසාන කරමින්, ඉන්දියාව, ජපානය සහ ප්‍රංශය විසින් සම-සභාපතිත්වය දරන නිල ණයහිමි කමිටුව සමඟ ද, චීන එක්සිම් බැංකුව සමඟ ද 2024 වසරේ ජූනි මස 26 වැනි දින ගිවිසුම්වලට එළඹෙන ලදී. ජපානය, ඉන්දියාව, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව, ඔස්ට්‍රියාව, බෙල්ජියම, කැනඩාව, ඩෙන්මාර්කය, ජර්මනිය, හංගේරියාව, දකුණු කොරියාව, නෙදර්ලන්තය, රුසියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, එක්සත් රාජධානිය හා එක්සත් ජනපදය යන නිල ණයහිමි කමිටුවේ සාමාජිකයන් සහ චීනය ඇතුළු ප්‍රධාන ද්විපාර්ශ්වික ණය හිමියන්ගේ ඇ.ඩො. බිලියන 10 ක ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ගිවිසුම්වලට එළඹී ඇති බැවින් මෙය ශ්‍රී ලංකා රජය විසින් අත්පත් කර ගන්නා ලද සුවිශේෂී ජයග්‍රහණයක් වේ.

නිල ණයහිමි කමිටුවේ එක් එක් සාමාජිකයා සමඟ වෙන් වෙන් වශයෙන් අවබෝධතා ගිවිසුම් හරහා සහ චීන එක්සිම් බැංකුව සමඟ දේශීය නියාමන විධිවිධාන අවසන් කිරීම මඟින් ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කරනු ඇත. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ද 2023 වසරේ දී අවසන් කර ඇති බැවින්, සමස්ත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට තව සම්පූර්ණ කිරීමට ඇත්තේ විදේශීය වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පමණි.

විදේශීය ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්වලට එළඹීම මඟින්, නිල ණයහිමි කමිටුවේ සහ චීන එක්සිම් බැංකුවේ ප්‍රධාන ජාත්‍යන්තර හවුල්කරුවන්ට ශ්‍රී ලංකාවට ද්විපාර්ශ්වික ණය ලබා දීම නැවත ආරම්භ කිරීමට හැකි වනු ඇත. විදේශ අරමුදල් මඟින් මූල්‍යනය කරනු ලබන රාජ්‍ය ආයෝජන නැවත ආරම්භ කිරීමත් සමඟ ඉදිකිරීම් ක්ෂේත්‍රයට මෙන්ම ආර්ථිකයට ද ධනාත්මක බලපෑමක් එල්ල වනු ඇත. තවද, නිල ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීම මඟින්, ප්‍රමුඛ වියදම් අවශ්‍යතා වෙත මුදල් ප්‍රවාහ ඉතුරුම් යොමු කිරීමට ඉඩ සලසමින් සැළකිය යුතු රාජ්‍ය මූල්‍ය සහනයක් ලබා දෙනු ඇත. මීට අමතරව, වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීමත් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීම මඟින් ණය ශ්‍රේණිගත කිරීම් හිතකර ලෙස සංශෝධනය වීමට ඉඩ සලසනු ඇති අතර, එමඟින් ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොල වෙත පහසු මෙන්ම මූල්‍යන පිරිවැය අඩු ප්‍රවේශයක් ලබා දෙනු ඇත.

## 1.2 උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 70 ක් පමණ වූ එහි උපරිම අගයේ සිට 2023 සහ 2024 වසරවල දී ශීඝ්‍රයෙන් පහත වැටුණු අතර, 2024 වසරේ මැයි මාසයේ දී එය සියයට 0.9 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, 2023 වසරේ ඔක්තෝම්බර් මස සිට 2024 වසරේ ජනවාරි මස දක්වා කාලය තුළ උද්ධමනය සුළු වශයෙන් වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලද අතර, 2024 වසරේ ජනවාරි මසට නියමිතව තිබූ එකතු කළ අගය මත බද්ද ඉහළයාම පිළිබඳව ඇති වූ මහජන අපේක්ෂාවන්, 2024 වසරේ ජනවාරි මාසයේ දී සැබවින්ම එකතු කළ අගය මත බදු ඉහළයාම, සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ආහාර සැපයුමට බාධා පැමිණීම, මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ නමුත්, 2024 වසරේ පෙබරවාරි මාසයේ දී මතුපිට උද්ධමනය යළිත් පහත වැටීමට පටන් ගත් අතර, සියයට 22 කින් විදුලි ගාස්තු අඩු කිරීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2024 වසරේ මාර්තු මාසයේ දී මතුපිට උද්ධමනයේ ශීඝ්‍ර අඩුවීමක් වාර්තා විය.

ඒ අනුව, උද්ධමනය 2024 වසරේ ජනවාරි මාසයේ දී පැවති සියයට 6.4 ක අගයක සිට 2024 වසරේ මැයි මාසයේ දී සියයට 0.9 ක් දක්වා අඩු විය. ඒ ආකාරයෙන්ම, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 6.5 ක සිට 2024 වසරේ මැයි මාසයේ දී සියයට 1.6 ක් දක්වා අඩු විය. මෙම උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදුලි ගාස්තු, ඉන්ධන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් මිල පහත දැමීමය. ඊට අමතරව ආහාර ද්‍රව්‍යවල මිල මධ්‍යස්ථ මට්ටමකට පැමිණීම සහ ඉල්ලුම අඩුවීම ද උද්ධමනය අඩුවීමට හේතු විය.

ආර්ථිකයේ නිතර මිල උච්චාවචනය වන අයිතම වන ආහාර, බලශක්තිය සහ ප්‍රවාහන කාණ්ඩ බැහැර කිරීම මඟින් යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය සැළකූ විට, කො.පා.මි.ද. (2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා කරන ලද සියයට 2.2 ක සිට 2024 වසරේ මැයි මාසයේ දී සියයට 3.5 ක් දක්වා වැඩි විය. එසේම, ජා.පා.මි.ද. (2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය ද 2024 වසරේ ජනවාරි මාසයේ දී පැවති සියයට 2.2 ක සිට 2024 වසරේ මැයි මාසයේ දී සියයට 3.1 ක් දක්වා වැඩි විය. ඉහත සඳහන් පරිදි ආන්තික ඉහළයාමක් තිබියදීත්, ආර්ථිකය තුළ ඉල්ලුමෙහි බලපෑම අවම වීම පිළිබිඹු කරමින්, මූලික උද්ධමනය අඩු මට්ටමක පැවතිණ. ආහාර මිල අඩුවීම සහ සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හේතුවෙන් ඉදිරි මාසවල දී උද්ධමනය ඉලක්කගත අගය වන සියයට 5 ක අගය ආසන්නයේ ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**1.1 වගුව : උද්ධමනයේ විචලනය**

| වසර | මාසය | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021 = 100) | | | | ජාතික පාරිභෝගික මිල දර්ශකය (2021 = 100) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය* | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය* | |
| | | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය |
| 2023 | පෙබරවාරි | 50.6 | ලැ.නො | 43.6 | ලැ.නො | 53.6 | ලැ.නො | 50.1 | ලැ.නො |
| | මාර්තු | 50.3 | ලැ.නො | 39.1 | ලැ.නො | 49.2 | ලැ.නො | 44.2 | ලැ.නො |
| | අප්‍රේල් | 35.3 | ලැ.නො | 27.8 | ලැ.නො | 33.6 | ලැ.නො | 31.8 | ලැ.නො |
| | මැයි | 25.2 | ලැ.නො | 20.3 | ලැ.නො | 22.1 | ලැ.නො | 21.6 | ලැ.නො |
| | ජූනි | 12.0 | ලැ.නො | 9.8 | ලැ.නො | 10.8 | ලැ.නො | 11.3 | ලැ.නො |
| | ජූලි | 6.3 | ලැ.නො | 5.9 | ලැ.නො | 4.6 | ලැ.නො | 6.3 | ලැ.නො |
| | අගෝස්තු | 4.0 | ලැ.නො | 4.6 | ලැ.නො | 2.1 | ලැ.නො | 4.1 | ලැ.නො |
| | සැප්තැම්බර් | 1.3 | ලැ.නො | 1.9 | ලැ.නො | 0.8 | ලැ.නො | 1.7 | ලැ.නො |
| | ඔක්තෝබර් | 1.5 | ලැ.නො | 1.2 | ලැ.නො | 1.0 | ලැ.නො | 0.6 | ලැ.නො |
| | නොවැම්බර් | 3.4 | ලැ.නො | 0.8 | ලැ.නො | 2.8 | ලැ.නො | 0.8 | ලැ.නො |
| | දෙසැම්බර් | 4.0 | 17.4 | 0.6 | 14.5 | 4.2 | 16.5 | 0.9 | 15.8 |
| 2024 | ජනවාරි | 6.4 | 14.2 | 2.2 | 11.3 | 6.5 | 13.4 | 2.2 | 12.3 |
| | පෙබරවාරි | 5.9 | 11.3 | 2.8 | 8.5 | 5.1 | 10.2 | 2.7 | 9.2 |
| | මාර්තු | 0.9 | 8.0 | 3.1 | 6.1 | 2.5 | 7.2 | 3.4 | 6.5 |
| | අප්‍රේල් | 1.5 | 5.7 | 3.4 | 4.4 | 2.7 | 5.2 | 3.0 | 4.6 |
| | මැයි | 0.9 | 3.9 | 3.5 | 3.3 | 1.6 | 3.7 | 3.1 | 3.3 |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

***කොළඹ පාරිභෝගික මිල දර්ශකය/ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව මූලික උද්ධමනය - ආහාර බලශක්ති සහ ප්‍රවාහනය යන නිතර වෙනස් වන අයිතම හැර*

*ලැ.නො. - ලැබී නොමැත*

## 1.3 මුදල් සහ ණය

ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම 2023 වසරේ ජූනි මාසයේ සිට මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. වසර ආරම්භයේ දී පිළිවෙළින් සියයට 9.00 සහ සියයට 10.00 ලෙස පැවති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2024 වසරේ මාර්තු මාසයේ දී පදනම් අංක 50 බැගින් අඩු කර, ඒවා පිළිවෙළින් සියයට 8.50 ක් සහ 9.50 ක් දක්වා අඩු කරන ලදී. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, වෙළඳපොළ පොලී අනුපාත, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ ඓතිහාසික වශයෙන් ඉහළම මට්ටමේ සිට මේ වන විට පහත වැටී ඇත. අඩු කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතවලට අනුකූලව රජයේ සුරැකුම්පත්වල අනුපාත ද අඛණ්ඩව පහත වැටුණි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 2024 වසර තුළ මේ දක්වා සියයට 2.00 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගෙන ඇත.

සැළකිය යුතු මට්ටමින් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම් සහ සමස්ත ද්‍රවශීලතා තත්ත්වයන් ඉහළ නංවා තිබිය දී වුවද, මේ වසරේ මේ දක්වා පෞද්ගලික අංශය වෙත ලැබුණු ණය ප්‍රවාහයේ සුළු වැඩිවීමක් පමණක් දක්නට ලැබුණි. වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් පහත හෙලීම පුද්ගලික අංශයේ ණය ඉහළයාම උත්තේජනය කිරීමට උපකාරී වන අතර එමඟින් ආර්ථිකය අඛණ්ඩව යළි නඟා සිටුවීමට පිටිවහලක් ලැබෙනු ඇත.

## 1.4 කොටස් වෙළෙඳපොළ

2024 වසරේ මුල් මාස පහ තුළ ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ ශීඝ්‍රයෙන් වර්ධනය විය. සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) 2023 වසරේ මැයි මස අවසානයේ දී පැවති ඒකක 8,555 ට සාපේක්ෂව 2024 වසරේ මැයි මස අවසානයේ දී ඒකක 12,106 ක් දක්වා සියයට 41.5 කින් වැඩි විය. වඩාත්ම ද්‍රවශීල කොටස් නියෝජනය කරනු ලබන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (2004 = 1,000) දර්ශකය ද 2023 වසරේ මැයි මාසයේ අග දී වාර්තා වූ ඒකක 2,421 ක සිට 2024 වසරේ මැයි මස අවසානයේ දී ඒකක 3,569 ක් දක්වා සියයට 47.4 කින් වැඩි විය.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සැලකීමේදී එය 2023 වසරේ මැයි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 3,598 ට සාපේක්ෂව 2024 වසරේ මැයි මස අවසානයේ දී රු. බිලියන 4,781 ක් දක්වා සියයට 32.8 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස පහ තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2023 වසරේ එම කාලය තුළ වාර්තා වූ රු. මිලියන 1,481 ට සාපේක්ෂව රු. මිලියන 1,767 ක් දක්වා සියයට 19.3 කින් වර්ධනය විය.

**1.2 වගුව : මුදල් හා වාණිජ බැංකු විසින් පුද්ගලික අංශයට ලබා දුන් ණය**

රු. බිලියන

| අයිතමය | 2023 | | | | 2024 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | 2024 අප්‍රේල්/2023 අප්‍රේල් වර්ධනය (%) |
| සංචිත මුදල් | 1,589.72 | 1,504.68 | 1,424.21 | 1,417.07 | 1,488.61 | 1,413.71 | 1,405.56 | 1,426.50 | 0.67 |
| පුළුල් මුදල් | 12,322.46 | 12,345.80 | 12,293.35 | 12,386.65 | 13,114.94 | 13,201.13 | 13,324.62 | 13,420.00 | 8.34 |
| පුද්ගලික අංශයට ලබා දුන් ණය | 7,315.43 | 7,257.89 | 7,138.36 | 7,087.70 | 7,314.21 | 7,321.48 | 7,393.38 | 7,377.20 | 4.08 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**1.3 වගුව: ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්යසාධනය**

| දර්ශකය | 2019 | 2020 | 2021 | 2022 | 2023 | මැයි අවසානය වන විට 2023 | මැයි අවසානය වන විට 2024 |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 6,129 | 6,774 | 12,226 | 8,490 | 10,594 | 8,555 | 12,106 |
| එස් ඇන්ඩ් පී. එස්. එල් 20 දර්ශකය | 2,937 | 2,638 | 4,233 | 2,636 | 3,010 | 2,421 | 3,569 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,851 | 2,961 | 5,489 | 3,847 | 4,261 | 3,598 | 4,781 |
| වෙළෙඳපොල කටයුතු සිදු කරනු ලබන ලැයිස්තු ගත සමාගම් ගණන | 289 | 283 | 296 | 290 | 290 | 289 | 284 |
| දෛනික පිරිවැටුම (රු. බිලියන) | 711 | 1,899 | 4,888 | 2,972 | 1,697 | 1,481 | 1,767 |
| විදේශ විකුණුම් (රු. මිලියන) | 68,272 | 104,165 | 86,689 | 36,863 | 34,810 | 13,809 | 32,540 |
| විදේශ මිලදී ගැණුම් (රු.මිලියන) | 56,537 | 52,889 | 39,410 | 67,488 | 39,826 | 15,168 | 24,423 |
| ශුද්ධ මිලදී ගැණුම් (රු.මිලියන) | -11,735 | -51,276 | -47,279 | 30,625 | 5,017 | 1,359 | -8,117 |

*මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළෙඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව*

### 1.5 විදේශ අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2024 වසරේ පළමු මාස හතර තුළ සේවක ප්‍රේෂණ සහ සංචාරක අංශයේ ඉපැයීම්වලින් ලැබෙන ලැබීම් ඉහළ යාමත් සමඟ ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව, 2024 වසරේ පළමු මාස හතර තුළ සේවක ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 2,079.9 ක් දක්වා සියයට 11.4 කින් ඉහළ ගොස් ඇති අතර සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 1,251.6 ක් දක්වා සියයට 91.9 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය.

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමඟ අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රවල වර්ධනය සහ විදේශ වෙළෙඳපොළේ ඉල්ලුම වැඩිවීම හේතුවෙන්, කාර්මික හා කෘෂිකාර්මික අපනයන ඉපැයීම් ඉහළ යාමත් සමඟ 2024 වසරේ පළමු මාස හතර තුළ අපනයන ආදායම ඇ.ඩො. මිලියන 4,056.1 ක් දක්වා සියයට 5.5 කින් ඉහළ ගියේය. ගෝලීය වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ මිල ඉහළ යාමේ බලපෑමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනය සහ ආනයන සීමාකිරීම් ඉවත් කිරීම හේතුවෙන් ඉහළ ගිය ඉල්ලුමත් සමඟ පාරිභෝගික භාණ්ඩ, අතරමැදි භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් 2024 වසරේ පළමු මාස හතර තුළ ආනයන වියදම ඇ. ඩො. මිලියන 5,833.2 දක්වා සියයට 9.5 කින් වර්ධනය විය. ඒ අනුව, ආනයන වියදම් ඉහළ යාම, අපනයන ආදායම ඉක්මවා යාම හේතුවෙන් වෙළෙඳ හිඟය 2023 වසරේ පළමු මාස හතර තුළ වූ ඇ.ඩො. මිලියන 1,479.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,777.1 ක් දක්වා පුළුල් විය.

මෑත වසරවල දී විදේශ රැකියා සඳහා පිටත්වීම් ඉහළ යාම සහ විධිමත් මාර්ග හරහා මුදල් ප්‍රේෂණය දිරිමත්

කිරීමට ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමඟ විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ලැබීම් සිදු වීම හේතුවෙන් සේවක ප්‍රේෂණ 2023 වසරේ පළමු මාස හතර තුළ වූ ඇ.ඩො. මිලියන 1,867.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,079.9 ක් දක්වා ඉහළ යන ලදී. කෙසේ වෙතත්, විදේශ රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන් සංඛ්‍යාව 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ පුද්ගලයින් 96,038 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 95,795 ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. මේ අතර, ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, චීනය සහ ප්‍රංශය යන රටවලින් සංචාරක පැමිණීම් වැඩිවීමත් සමඟ සංචාරක ඉපැයීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී ලද ඇ.ඩො. මිලියන 652.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,251.6 ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. සංචාරක පැමිණීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ පුද්ගලයින් 441,177 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 784,651 ක් දක්වා සියයට 77.9 කින් වර්ධනය විය.

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 3.9 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 23.4 ක් දක්වා ශුද්ධ ලැබීමේ වැඩිවීමක් වාර්තා කළේය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි 2023 වසරේ පළමු මාස හතර තුළ වූ ඇ.ඩො. මිලියන 252.2 ක ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 113.0 ක ශුද්ධ පිටතට ගලායාමක් වාර්තා විය. මේ අතර, චීනයේ මහජන බැංකුවෙන් ලද ඇ.ඩො. බිලියන 1.5 ක විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළුව දළ නිල සංචිතය 2024 වසරේ අප්‍රේල් මස අවසන් වන විට ඇ.ඩො. බිලියන 5.5 ක් විය.

සමස්ත ගෙවුම් ශේෂය (BoP) 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 883.3 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ පළමු මාස හතර තුළ දී ඇ.ඩො. මිලියන 1,288.2 ක අතිරික්තයක් සමඟින් වර්ධනය වී ඇත. 2024 වසරේ මැයි මස 31 වන දින අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 7.3 කින් අතිප්‍රමාණය විය.

**1.4 වගුව: විදේශ වෙළඳාම : 2024 වසරේ ජනවාරි - අප්‍රේල්**

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2023 | 2024 | වර්ධනය % |
|---|---|---|---|
| **අපනයන** | **3,846.2** | **4,056.1** | **5.5** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 792.3 | 828.4 | 4.6 |
| තේ | 407.7 | 450.2 | 10.4 |
| ප්‍රාථමික නිෂ්පාදන ( රබර් හා පොල් නිෂ්පාදන) | 114.1 | 133.7 | 17.2 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 270.5 | 244.5 | -9.6 |
| කාර්මික නිෂ්පාදන | 3,035.6 | 3,210.1 | 5.7 |
| රෙදිපිළි සහ ඇගලුම් | 1,616.7 | 1,570.0 | -2.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 168.7 | 369.8 | 119.2 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 1,250.2 | 1,270.3 | 1.6 |
| ඛනිජ නිෂ්පාදන | 9.1 | 8.4 | -7.9 |
| අනෙකුත් | 9.3 | 9.2 | -0.9 |
| **ආනයන** | **5,325.2** | **5,833.2** | **9.5** |
| පාරිභෝගික භාණ්ඩ | 948.8 | 1,058.5 | 11.6 |
| ආහාර හා පාන වර්ග | 500.0 | 577.2 | 15.4 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 448.8 | 481.3 | 7.2 |
| අතරමැදි භාණ්ඩ | 3,600.6 | 3,778.5 | 4.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 1,635.1 | 1,529.7 | -6.4 |
| පොහොර | 50.1 | 23.9 | -52.4 |
| රෙදිපිළි සහ ඇගලුම් | 787.2 | 866.9 | 10.1 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 1,128.2 | 1,358.0 | 20.4 |
| ආයෝජන භාණ්ඩ | 769.9 | 991.4 | 28.8 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 526.8 | 666.3 | 26.5 |
| ප්‍රවාහන උපකරණ | 26.8 | 40.5 | 51.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 215.3 | 283.8 | 31.8 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 1.0 | 0.8 | -23.9 |
| අනෙකුත් | 5.8 | 4.7 | -18.9 |
| **වෙළෙඳ ශේෂය** | **-1,479.0** | **-1,777.1** | **-20.2** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## අපනයන

රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම අඩු වුවද ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉපැයීම් වැඩිවීම හේතුවෙන් අපනයන ඉපැයීම්, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 3,846.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 4,056.1 දක්වා සියයට 5.5 කින් ඉහළ ගියේ ය. කාර්මික අපනයන ඉපැයීම් මුළු අපනයන ආදායමට සියයට 79.1 ක දායකත්වයක් ලබාදී ඇති අතර කෘෂිකාර්මික හා ඛනිජ අපනයන සමස්ත අපනයන ආදායමෙන් පිළිවෙළින් සියයට 20.4 ක් සහ සියයට 0.2 ක් විය.

ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අපනයන ආදායම වැඩිවීම හේතුවෙන් කාර්මික අපනයන ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී ලද ඇ.ඩො. මිලියන 3,035.6 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,210.1 ක් දක්වා සියයට 5.7 කින් වැඩි විය. නැව් සහ ගුවන් ඉන්ධන අපනයන පරිමාවේ වැඩිවීමත් සමඟ ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ඉපැයීම් ඇ. ඩො. මිලියන 369.8 ක් දක්වා සියයට 119.2 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. රබර් නිෂ්පාදනවලින් ලද අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 326.9 ක් දක්වා සියයට 14.3 කින් ඉහළ ගොස් ඇති අතර ආහාර, පාන සහ දුම්කොළවලින් ඉපැයීම් ඇ.ඩො. මිලියන 206.3 ක් දක්වා සියයට 28.3 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, රෙදිපිළි සහ ඇඟලුම් මගින් ලද අපනයන ඉපැයීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 1,616.7 ට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 1,570.0 ක් දක්වා සියයට 2.9 කින් අඩු වී ඇත. තවද, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ, සත්ත්ව ආහාර සහ ප්‍රවාහන උපකරණවලින් අපනයන ආදායම පහත වැටී ඇති අතර රසායනික නිෂ්පාදන, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ දැව සහ කඩදාසි නිෂ්පාදනවලින් අපනයන ආදායම ඉහළ යාමක් වාර්තා විය.

තේ, පොල්, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන සහ එළවළුවලින් ලද අපනයන ඉපැයීම් වැඩිවීමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 792.3 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 828.4 ක් දක්වා සියයට 4.6 කින් ඉහළ ගියේය. තේ අපනයන පරිමාවන් ඉහළ යාමත් සමඟ 2024 වසරේ පළමු මාස හතර තුළ දී තේ අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 450.2 ක් දක්වා සියයට 10.4 කින් වැඩි විය. තවද, අපනයන ආදායම පොල්වලින් ඇ.ඩො. මිලියන 125.6 ක් දක්වා සියයට 24.1 කින් ද, සුළු කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ඇ.ඩො. මිලියන 52.9 ක් දක්වා සියයට 33.5 කින් ද, එළවළුවලින් ඇ.ඩො. මිලියන 9.2 ක් දක්වා සියයට 0.6 කින් ද ඉහළ ගියේය. කෙසේ වෙතත්, කුළුබඩු, මුහුදු ආහාර, රබර් සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පිළිවෙළින් ඇ.ඩො. මිලියන 84.7 ක් දක්වා සියයට 30.2 කින් ද, ඇ.ඩො. මිලියන 90.7 ක් දක්වා සියයට 0.9 කින් ද, ඇ.ඩො. මිලියන 8.1 ක් දක්වා සියයට 37.2 කින් ද, ඇ. ඩො. මිලියන 7.0 ක් දක්වා සියයට 21.7 කින් ද, 2024 වසරේ පළමු මාස හතර තුළ දී පහත වැටී ඇත. මේ අතර, ඛනිජ අපනයන ඉපැයීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී ඇ.ඩො. මිලියන 9.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 8.4 ක් දක්වා සියයට 7.9 කින් අඩු විය.

## ආනයන

ආර්ථික ක්‍රියාකාරකම්හි පුනර්ජීවනය සහ අත්‍යාවශ්‍ය නොවන ආනයනික භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ඉවත් කිරීමත් සමඟ ඉල්ලුම ඉහළ යාමෙන් පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් ආනයන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ. ඩො. මිලියන 5,325.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 5,833.2 ක් දක්වා සියයට 9.5 කින් වැඩි විය. පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,058.5 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය වූ අතර එය මුළු ආනයන වියදමෙන් සියයට 18.1 ක් විය. තවද, අතරමැදි භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 3,778.5 ක් දක්වා සියයට 4.9 කින් ඉහළ ගොස් මුළු ආනයන වියදමෙන් සියයට 64.8 කට දායක වූ අතර ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 991.4 ක් දක්වා සියයට 28.8 කින් ඉහළ ගොස් මුළු අපනයන වියදමෙන් සියයට 7.0 ක් වීය.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 948.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,058.5 ක් දක්වා සියයට 11.6 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර ආහාර පාන සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙකෙහිම ආනයන වියදම් වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. සීනි සහ රසකැවිලි සහ කුළුබඩු සඳහා වන වියදම් පහත වැටුණ ද අනෙකුත් සියලුම උප කාණ්ඩවල වියදම් ඉහළ යාමත් සමඟ ආහාර සහ පාන සඳහා ආනයන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 500.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 577.2 ක් දක්වා සියයට 15.4 කින් වැඩි විය. ඒ අනුව, එළවළු, කිරි නිෂ්පාදන, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සහ මුහුදු ආහාර යන කාණ්ඩ සඳහා ආනයන වියදම් ඉහළ ගියේය. බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදන සඳහා වන වියදම් අඩු වුවද, ප්‍රධාන වශයෙන් රෙදිපිළි සහ උපාංග, ගෘහ උපකරණ සහ විදුලි සංදේශ උපකරණ සඳහා වන වියදම් ඉහළ යාම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 448.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 481.2 ක් දක්වා සියයට 7.2 කින් ඉහළ ගියේය.

රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදන, මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ කඩදාසි හා සන කඩදාසි සහ උපාංග ආනයන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 3,600.6 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,778.5 ක් දක්වා සියයට 4.9 කින්

වැඩි විය. පිරිපහදු කළ ඛනිජතෙල් සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 1,015.9 ක් දක්වා සියයට 0.7 කින් සහ බොරතෙල් ඇ.ඩො. මිලියන 373.1 ක් දක්වා සියයට 19.4 කින් ඉහළ ගොස් තිබියදීත්, ගල් අඟුරු ආනයන වියදම ඇ.ඩො. මිලියන 140.7 ක් දක්වා සියයට 55.1 කින් සැළකිය යුතු ලෙස අඩු වීමත් සමඟ ඉන්ධන ආනයන වියදම 2024 වසරේ පළමු මාස හතර තුළ දී ඇ.ඩො. මිලියන 1,529.7 ක් දක්වා සියයට 6.4 කින් අඩු වී ඇත. තවද, 2024 පළමු මාස හතර තුළ දී දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග, තිරිඟු සහ ඉරිඟු, කෘෂිකාර්මික යෙදවුම් සහ පොහොර ආනයන වියදම් අඩු විය.

ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 769.9 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 991.4 ක් දක්වා සියයට 28.8 කින් වැඩි විය. විදේශ වෙළෙඳපොළවල මිල ගණන් ඉහළ යාම සහ ආර්ථිකයේ පුනර්ජීවනයත් සමඟ ආයෝජන කටයුතු ඉහළ යාම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 666.3 ක් දක්වා සියයට 26.5 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ඇ.ඩො. මිලියන 283.8 ක් දක්වා සියයට 31.8 කින් ද, ප්‍රවාහන උපකරණ ඇ.ඩො. මිලියන 40.5 ක් දක්වා සියයට 51.4 කින් ද ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

## 1.6 ගෝලීය ආර්ථික ප්‍රවණතා

ගෝලීය ආර්ථිකය, 2022-2023 වසර කාලය තුළ දී අඛණ්ඩව ඉස්මතුවූ ආර්ථික අභියෝගයන් හමුවේ ශක්තිමත්ව පැවතුණි. 2022 වසරේ මැද භාගයේ දී පෙන්නුම් කරන ලද වාර්තාගත ලෙස ඉහළ උද්ධමන අගයේ සිට නිර්-උද්ධමනය වෙමින් පැවති ගෝලීය උද්ධමනය සහ ඉහළ පොලී අනුපාත මධ්‍යයේ වුවද, ගෝලීය ආර්ථිකය 2022 වසරේ දී සහ 2023 වසරේ දී පිළිවෙළින් සියයට 3.5 ක සහ 3.2 ක අගයකින් වර්ධනය විය.

භූ දේශපාලනික අස්ථාවරත්වයන්, මූලික උද්ධමනය ඉහළ යෑම සහ ශ්‍රම වෙළෙඳපොළ තුළ ශ්‍රමිකයන්ගේ හිඟයක් පැවතීමේ අපේක්ෂාවන්, ඉහළ පොලී අනුපාත පිළිබඳ මහජනතාවගේ මතය සහ පවතින වත්කම්වල මිල පහත වැටීම ආදිය ආශ්‍රිත අවදානම තවදුරටත් පවතින නමුත්, එම අවදානම පුළුල් ලෙස තුලනය වී ඇති බවක් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, උද්ධමනය ඉලක්කගත මට්ටම්වල පවත්වා ගැනීම මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම සහ මහ බැංකු විසින් අඛණ්ඩව මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම ගෝලීය වර්ධනයේ ඉදිරි දැක්මට බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය ආර්ථිකය, 2024 වසරේ සහ 2025 වසරේ දී සියයට 3.2 ක් බැගින් වර්ධනය වීමට නියමිත අතර කෝවිඩ්-19 වසංගතයේ පසු බලපෑම්, භූ-දේශපාලනික අර්බුද, නිෂ්පාදන අංශයෙහි දුර්වල වර්ධනය සහ උග්‍ර වෙමින් පවතින භූ-ආර්ථික බෙදීයාම හේතුවෙන් එම අගය විශේෂයෙන්ම 2000-2019 වසර කාලය තුළ පැවති සියයට 3.8 ක ඓතිහාසික වශයෙන් සාමාන්‍ය අගයට වඩා අඩු මට්ටමක පවතී. සංසන්දනාත්මක ලෙස අඩු වර්ධනක් පෙන්නුම් කරන මෙම ඉදිරි දැක්ම තුළින් සීමාකාරී මුදල් ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය සහය ඉවත් කිරීම සහ අඩු ඵලදායිතා වර්ධනය ආදිය පිළිබිඹු කරයි.

### ගෝලීය ආර්ථික වර්ධනය

දියුණු ආර්ථිකයන් සහ නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් යන දෙකෙහිම 2024-26 වසරවල් සඳහා වර්ධනය වසංගතයට පෙර දශකයට සමගාමීව මන්දගාමී වනු ඇත. එක්සත් ජනපදයේ සියයට 2.7 ක්, යුරෝ කලාපයේ සියයට 0.8 ක්, ජපානයේ සියයට 0.9 ක් සහ අනෙකුත් දියුණු ආර්ථිකයන්හි සියයට 1.6 ක් ලෙස පුරෝකථනය කර ඇති වර්ධනය හේතුවෙන් 2024 වසරේ දී දියුණු ආර්ථිකයන්හි වර්ධනය සියයට 1.7 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. යුක්‍රේන-රුසියා අර්බුදයේ බලපෑම් හේතුවෙන් 2023 වසරේ දී සියයට 0.4 ක අඩු වර්ධනයක් පෙන්නුම් කළ යුරෝ ප්‍රදේශය යථා තත්ත්වයට පත්වීම, දියුණු ආර්ථිකයන්හි මධ්‍යස්ථ වර්ධනයට හේතු විය. 2023 වසරේ දී පැවති වර්ධනයට සහාය වූ එක්වරක් පමණක් ක්‍රියාත්මක කරන ලද සාධකවල බලපෑම එක් වරම වියැකී යාම හේතුවෙන් ජපානයේ වර්ධනය 2023 වසරේ දී වූ සියයට 1.9 ක අගයක සිට 2024 වසරේ දී සියයට 0.9 ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**1.5: වගුව** ලෝක තත්ත්වය - 2023

| රට | 2023 | | | | |
|---|---|---|---|---|---|
| | ද.දේ.නි.වර්ධනය (වාර්ෂික ප්‍රතිශතක වෙනස) | උද්ධමනය (ප්‍රතිශතය) | සේවා වියුක්තිය (ප්‍රතිශතය) | රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | දළ ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) |
| ආර්ජන්ටිනාව | -1.6 | 133.5 | 6.6 | -4.2 | 154.5 |
| ඕස්ට්‍රේලියාව | 2.1 | 5.6 | 3.7 | -0.9 | 49.4 |
| බ්‍රසීලය | 2.9 | 4.6 | 8.0 | -7.9 | 84.7 |
| කැනඩාව | 1.1 | 3.9 | 5.4 | -0.6 | 107.1 |
| චිලී | 0.2 | 7.6 | 8.8 | -2.2 | 39.4 |
| චීනය | 5.2 | 0.2 | 5.2 | -7.1 | 83.6 |
| ප්‍රංශය | 0.9 | 5.7 | 7.4 | -5.5 | 110.6 |
| ජර්මනිය | -0.3 | 6.0 | 3.0 | -2.1 | 64.3 |
| ග්‍රීසිය | 2.0 | 4.2 | 10.9 | -1.6 | 168.8 |
| ඉන්දියාව | 7.8 | 5.4 | ලැ.නො | -8.6 | 82.7 |
| ඉන්දුනීසියාව | 5.0 | 3.7 | 5.3 | -1.6 | 39.9 |
| ඉතාලිය | 0.9 | 5.9 | 7.7 | -7.2 | 137.3 |
| ජපානය | 1.9 | 3.3 | 2.6 | -5.8 | 252.4 |
| කොරියාව | 1.4 | 3.6 | 2.7 | -1.0 | 55.2 |
| මැලේසියාව | 3.7 | 2.5 | 3.6 | -4.4 | 67.3 |
| මෙක්සිකෝව | 3.2 | 5.5 | 2.8 | -4.3 | 53.1 |
| රුසියාව | 3.6 | 5.9 | 3.2 | -2.3 | 19.7 |
| සිංගප්පූරුව | 1.1 | 4.8 | 1.9 | 3.6 | 162.1 |
| දකුණු අප්‍රිකාව | 0.6 | 5.9 | 32.8 | -6.0 | 73.9 |
| ස්පාඤ්ඤය | 2.5 | 3.4 | 12.1 | -3.6 | 107.5 |
| ශ්‍රී ලංකාව | -2.3 | 17.4 | 4.7 | -8.3 | 103.9 |
| තායිලන්තය | 1.9 | 1.2 | 1.2 | -3.2 | 62.4 |
| එක්සත් රාජධානිය | 0.1 | 7.3 | 4.0 | -6.0 | 101.1 |
| එක්සත් ජනපදය | 2.5 | 4.1 | 3.6 | -8.8 | 122.1 |
| වියට්නාමය | 5.0 | 3.3 | 2.0 | -1.6 | 34.0 |
| වෙනිසියුලාව | 4.0 | 337.5 | ලැ.නො | -3.4 | 148.2 |

*මූලාශ්‍ර: ලෝක ආර්ථික විශ්ලේෂණය, ජා.මූ.අ, අප්‍රේල් 2024, Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප්‍රේල් 2024*

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි වර්ධනය 2024-26 වසර කාලයේ දී වසරකට සියයට 4 කට වඩා වැඩි වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වසංගතයෙන් පසු පරිභෝජනය ඉහළ යෑම සහ රාජ්‍ය මූල්‍ය උත්තේජකයන් ඇතුළු එක්වරක් පමණක් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ගයන්හි ධනාත්මක බලපෑම පහව යෑම සහ දේපල අංශය අඛණ්ඩව දුර්වල වීම හේතුවෙන් චීනයේ වර්ධනය 2023 වසරේ දී වාර්තා කරන ලද සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී පහත වැටී, 2025 වසර සහ 2026 වසරේ දී තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. චීනය හැර, අනෙකුත් නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි වර්ධනය මෙම වසරේ දී සියයට 3.5 ක් දක්වා ඉහළ ගොස්, ඉන් පසුව 2025-26 වසර කාලයේ දී සියයට 3.9 ක සාමාන්‍ය අගයක් දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. දේශීය ඉල්ලුම වැඩි වීම සහ වැඩකරන වයසේ ජනගහනය වැඩිවීමේ බලපෑම් හේතුවෙන් ඉන්දියාවේ ආර්ථික වර්ධනය 2024 වසරේ දී සියයට 6.8 ක් සහ 2025 වසරේ දී සියයට 6.5 ක් ලෙස ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අඩු ආදායම්ලාභී සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධනය 2023 වසරේ දී සියයට 4.0 ක අගයක සිට 2024 වසරේ දී සියයට 4.7 ක් දක්වා සහ 2025 වසරේ දී සියයට

5.2 ක් දක්වා තවදුරටත් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වඩා හොඳ ආයෝජනයන්, පරිභෝජනය යථා තත්ත්වයට පත් වීම සහ ඉලෙක්ට්‍රොනික හා සේවා අපනයන්හි වර්ධනය හේතුවෙන්, ඉන්දියාව, ආසියාව තුළ ප්‍රධාන වර්ධන ආර්ථිකයක් ලෙස සිය ස්ථාවරත්වය තහවුරු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. පකිස්ථානයේ සහ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීකරණය 2024 වසරේ දී ධනාත්මක වර්ධනයකට සහ 2025 වසරේ දී වඩාත් වේගවත් වර්ධනයකට හේතු වනු ඇත.

## උද්ධමනය

2022 වසරේ සිට ප්‍රතිපත්ති පොලී අනුපාත ලිහිල් කිරීම හේතුවෙන් මතුපිට උද්ධමනය ක්‍රමයෙන් අඩු වීමත් සමඟ, ගෝලීය වශයෙන් වන මතුපිට සහ මූලික උද්ධමන අගයන් 2024 වසරේ දී සහ 2025 වසරේ දී තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය වශයෙන් වන මතුපිට උද්ධමනය 2023 වසරේ දී පැවති සියයට 6.8 ක අගයක සිට 2024 වසරේ දී සියයට 5.9 ක් දක්වා පහත වැටී ඉන් අනතුරුව, 2025 වසරේ දී සියයට 4.5 ක් දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළෙඳ භාණ්ඩ මිලෙහි සුළු අඩු වීමකට අමතරව සේවා ඉල්ලුම මධ්‍යස්ථ වීම සහ වැටුප් වර්ධනය මන්දගාමී වීමත් සමඟ මූලික උද්ධමනය ලිහිල් වීම මෙම පහත වැටීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දියුණු ආර්ථිකයන් හි උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ සියයට 4.6 ක අගයක සිට 2024 වසරේ දී සියයට 2.6 ක අගයක් දක්වා සියයට 2.0 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන් හි උද්ධමනය 2025 වසරේ දී පූර්ව වසංගත උද්ධමන මට්ටම් කරා ළඟා වනු ඇත. නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි උද්ධමනය 2023 වසරේ දී මෙන් 2024 වසරේ දී ද සියයට 8.3 ක අගයක අඛණ්ඩව පැවතීමත් සමඟ නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි නිර්-උද්ධමන වේගය සාපේක්ෂව අඩු විය. 2026 වසර පමණ වන විට නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට ඔවුන්ගේ පූර්ව වසංගත සාමාන්‍යය වන සියයට 5.0 ක අගයකට ළඟා වීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ

තෙල් මිල පහත වැටීම හේතුවෙන් 2023 වසරේ අගෝස්තු මස සහ 2024 වසරේ පෙබරවාරි මස අතර කාලය තුළ ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ මිලෙහි සුළු අඩුවීමක් වාර්තා විය. 2024 වසරේ දී තෙල් මිල ගණන් සියයට 2.5 ක අපේක්ෂිත අගයකින් පමණ පහත වැටෙනු ඇතැයි ද, ඒ හේතුවෙන් ඉන්ධන භාණ්ඩවල මිල සියයට 9.7 කින් පහත වැටෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ආහාර ද්‍රව්‍ය මෙන්ම ගල් අඟුරු සහ ස්වභාවික වායු සඳහා ද මිළ පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වාර්ෂික ලක්ෂ්‍යමය භාණ්ඩ මිල දර්ශකය 2024 වසරේ දී සහ 2025 වසරේ දී පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 4 කින් පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. කොකෝවා සහ කෝපි මිලෙහි වැඩිවීම වේගවත්වීම හේතුවෙන්, කෘෂිකාර්මික මිල දර්ශකය 2024 වසරේ අප්‍රේල් මස මුලදී වැඩි විය. කෙසේ වෙතත්, සැපයුම වැඩි වීම සහ එල් නිනෝ කාලගුණ තත්ත්වය පහව යෑම සමඟ, කෘෂිකාර්මික මිල දර්ශකය 2024 වසරේ දී සහ 2025 වසරේ දී පිළිවෙළින් සියයට 1 කින් සහ සියයට 4 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බලශක්ති මිල දර්ශකය 2024 වසරේ දී සියයට 3 කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන අතර 2025 වසරේ දී එම අගය තවත් සියයට 4 කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ලෝහ මිල දර්ශකය 2024-25 වසර වලදී නොවෙනස්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ දී සුළු වශයෙන් අඩු වීමට ප්‍රථම 2024 වසරේ දී රන් මිල සියයට 8 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

**1.6 වගුව: ජාත්‍යන්තර භාණ්ඩ මිළ ගණන්**

| අයිතමය | ඒකකය | තත්‍ය | | ඇස්තමේන්තු | |
|---|---|---|---|---|---|
| | | 2022 | 2023 | 2024 | 2025 |
| බලශක්ති | | | | | |
| ගල් අඟුරු ඕස්ට්‍රේලියාව | මෙ.ටො./ ඩොලර් | 344.9 | 172.8 | 125.0 | 110.0 |
| බොරතෙල් සාමාන්‍යය | බැරලයට ඩොලර් | 99.8 | 82.6 | 84.0 | 79.0 |
| ස්වාභාවික වායු එක්සත් ජනපද | මෙට්‍රික් බ්‍රිතාන්‍ය තාප ඒකක මිලියනයට/ ඩොලර් | 6.4 | 2.5 | 2.4 | 3.5 |
| බලශක්ති නොවන | | | | | |
| කෘෂිකාර්මික | | | | | |
| පාන වර්ග | | | | | |
| කොකෝවා | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.39 | 3.28 | 5.00 | 4.00 |
| කෝපි, රොබොස්ටා | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.29 | 2.63 | 3.50 | 2.80 |
| තේ | කිලෝග්‍රෑමයට ඩොලර් | 3.05 | 2.74 | 2.75 | 2.77 |
| ආහාර | | | | | |
| මේද සහ තෙල් | | | | | |
| පාම් තෙල් | මෙ.ටො./ ඩොලර් | 1,276 | 886 | 905 | 825 |
| සෝයා පිටි | මෙ.ටො./ ඩොලර් | 548 | 541 | 480 | 460 |
| සෝයා බෝංචි | මෙ.ටො./ ඩොලර් | 675 | 598 | 500 | 475 |
| ධාන්‍ය | | | | | |
| බඩ ඉරිඟු | මෙ.ටො./ ඩොලර් | 319 | 253 | 200 | 195 |
| සහල් | මෙ.ටො./ ඩොලර් | 437 | 554 | 595 | 550 |
| තිරිඟු | මෙ.ටො./ ඩොලර් | 430 | 340 | 290 | 295 |
| අනෙකුත් ආහාර | | | | | |
| සීනි | කිලෝග්‍රෑමයට ඩොලර් | 0.40 | 0.52 | 0.50 | 0.46 |
| අමුද්‍රව්‍ය | | | | | |
| කපු | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.86 | 2.09 | 2.15 | 2.20 |
| රබර් | කිලෝග්‍රෑමයට ඩොලර් | 1.54 | 1.38 | 1.55 | 1.60 |
| ඉරූ දැව, අරටු සහිත ලී | ඝනමීටරයට ඩොලර් | 675 | 678 | 680 | 690 |
| ලෝහ සහ ඛනිජ වර්ග | | | | | |
| ඇලුමිනියම් | මෙ.ටො./ ඩොලර් | 2,705 | 2,256 | 2,300 | 2,400 |
| තඹ | මෙ.ටො./ ඩොලර් | 8,822 | 8,490 | 8,900 | 8,800 |
| නිකල් | මෙ.ටො./ ඩොලර් | 25,834 | 21,521 | 17,000 | 18,000 |

*මූලාශ්‍රය: Commodity Markets Outlook, ලෝක බැංකුව, අප්‍රේල් 2024*

### ගෝලීය වෙළෙඳාම

ගෝලීය කාර්මික නිෂ්පාදනය මන්දගාමී වීම හේතුවෙන්, 2023 වසරේ දී භාණ්ඩ වෙළෙඳාමේ පරිමාව සියයට 1.9 කින් සංකෝචනය විය. කෙසේ වෙතත්, භාණ්ඩ වෙළඳාමේ වැඩිදියුණු වීම් සහ ගෘහස්ථ පරිභෝජනය ඉහළ යාම හේතුවෙන්, 2024 වසරේ දී ගෝලීය වෙළෙඳාම දියුණු වීමේ සළකුණු පෙන්නුම් කරයි. ගෝලීය වෙළෙඳාමෙහි වර්ධනය 2024 වසරේ දී සියයට 3.0 ක් සහ 2025 වසරේ දී සියයට 3.3 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එසේ වුවද, කලාපීය අර්බුද සහ භූ දේශපාලන අස්ථාවරත්වයන් මෙම වර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. තවද, වෙළෙඳමෙහි වර්ධනය 2000-2019 කාලය තුළ ඓතිහාසික වශයෙන් පැවති සියයට 4.9 ක සාමාන්‍ය අගයට වඩා අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### මුදල් හා මූල්‍ය අංශය

උද්ධමනය මැඩලීම සඳහා බොහෝ මහ බැංකු විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන් ඉහළ නැංවීම උකස් වෙළෙඳපොළ පිරිවැය වැඩිවීම, ණය ප්‍රතිමූල්‍යකරණය අසීරු වීම, ව්‍යාපාර බංකොලොත්භාවය සහ අඩු උද්ධමනයට හේතු විය.. කෙසේ වෙතත්, 2024 වසර දෙවන භාගය වන විට, ක්‍රමයෙන් අඩුවනු ඇතැයි පුරෝකථනය කර ඇති උද්ධමනයට සමගාමීව, දියුණු ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති අනුපාතිකයන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බොහෝ මහ බැංකුවල ප්‍රතිපත්ති අනුපාතිකයන් ඉහළ නැංවීමේ චක්‍ර සම්පූර්ණ වී ඇති අතර සමහරක් මහ බැංකු විසින් ප්‍රතිපත්ති අනුපාතිකයන් ලිහිල් කිරීමට පටන් ගෙන තිබුණ ද, තවමත් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ මට්ටමක පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස, පුරෝකථනය කර ඇති උද්ධමන අගය පහත වැටීම හේතුවෙන් මූර්ත පොලී අනුපාතිකය ඉහළ ගොස් ඇත. මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීමේ පසු බලපෑම් සහ ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදනය හේතුවෙන් දකුණු ආසියාවේ, අග්නිදිග ආසියාවේ සහ මධ්‍යම ආසියාවේ උද්ධමනය අඩු වීමට ඉවහල් වනු ඇත. නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වීම සඳහා රාජ්‍ය මූල්‍ය සීමා කිරීම් ද අවශ්‍ය වනු ඇත.

බොහෝ රටවලට පහසුවෙන් අවදානමට ලක්විය හැකි තම ජනතාව ආරක්ෂා කරගන්නා අතරතුර රාජ්‍ය මූල්‍ය තිරසරභාවය ආරක්ෂා කර ගැනීමට සහ ස්වාරක්ෂක නැවත ගොඩ නැගීම සඳහා විශාල රාජ්‍ය මූල්‍ය ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන් 2024 වසරේ දී ඔවුන්ගේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කරනු ඇතැයි අපේක්ෂා කරන අතර නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2024 වසරේ දී මධ්‍යස්ථ රාජ්‍ය මූල්‍ය ස්ථාවරයක් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 2 වන පරිච්ඡේදය

# රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

## 2.1 සමාලෝචනය

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සවිමත් කිරීම සඳහා රජය දරන ප්‍රයත්නයන් හේතුවෙන් රාජ්‍ය වියදම පහළ යාමත්, රාජ්‍ය ආදායම් එක්රැස් කිරීම ඉහළ නැංවීමත් සමඟ 2024 වසරේ පළමු මාස හතර තුළ රාජ්‍ය මූල්‍ය අංශය ඉහළ කාර්යසාධනයක් පෙන්වීය. ඒ අනුව, 2023 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 5.3 ක ප්‍රාථමික හිඟයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 365.0 ක ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් වාර්තා විය. අයවැය හිඟය ද 2023 වසරේ පළමු මාස හතර සමඟ සැසඳීමේ දී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 361.1 දක්වා රු. බිලියන 463.2 කින් අඩු විය.

වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 29.5 ක් ලඟා කර ගනිමින්, සමස්ත රාජ්‍ය ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද රු. බිලියන 821.3 ට සාපේක්ෂව 2024 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 1,218.1 දක්වා සියයට 48.3 කින් එනම්, රු. බිලියන 396.7 කින් වර්ධනය විය. මෙම කැපීපෙනෙන වර්ධනය සඳහා 2022 වසරේ ජූනි මාසයේ සිට හඳුන්වාදෙන ලද පුළුල් බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ආදායම් පරිපාලනයේ ක්‍රමික කාර්යසාධනය, 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට වාර්තා වූ ධනාත්මක ආර්ථික වර්ධනය සහ ආනයන සීමා කිරීම් ක්‍රමිකව ඉවත් කිරීම ඇතුළු සාධක කිහිපයක ප්‍රතිඵලයකි. 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 29.3 ක් ලඟා කරගනිමින් 2024 වසරේ පළමු මාස හතර තුළ දී රැස් කර ගත් බදු ආදායම රු. බිලියන 1,117.8 දක්වා සියයට 50.5 කින් වර්ධනය විය.

ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනයන් සමඟ රාජ්‍ය හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ නැංවීම සහ 2023 වසරේ ජනවාරි මස පළමු වන දා සිට හඳුන්වා දුන් බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සම්පූර්ණ බලපෑම යනාදිය හේතුවෙන් ආදායම් බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී ලද රු. බිලියන 191.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 244.0 දක්වා සියයට 27.3 කින් වැඩි විය.

2023 වසරේ පළමු මාස හතර තුළ භාණ්ඩ හා සේවා මත බදු මඟින් ලද ආදායමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද ආදායම රු. බිලියන 724.5 දක්වා සියයට 63.8 කින් වැඩි විය. එකතු කළ අගය මත බදු අනුපාතික ඉහළ නැංවීම, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම සහ ආනයන සීමා ඉවත් කිරීමේ බලපෑම මෙන්ම එකතු කළ අගය මත බද්ද සඳහා ලබා දී තිබූ බදු නිදහස් කිරීම්වලින් වැඩි බහුතරයක් ඉවත් කිරීම එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 422.9 දක්වා සියයට 89.5 කින් වැඩි වීමට හේතු විය. ඛනිජතෙල් මත නිෂ්පාදන බද්ද ඉහළ නැංවීම හේතුවෙන් නිෂ්පාදන බද්දෙන් ලද ආදායම රු. බිලියන 198.3 දක්වා සියයට 45.2 කින් වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් භාණ්ඩ හා සේවා මත අනෙකුත් බදු මඟින් ලද ආදායම ද රු. බිලියන 103.3 දක්වා සියයට 25.1 කින් වර්ධනය විය.

2023 වසරේ තුන්වන කාර්තුවේ සිට ආනයන සීමා ඉවත් කිරීම මත 2024 වසරේ පළමු මාස හතර තුළ ප්‍රධාන වශයෙන්ම රේගු ආනයන බද්දෙන් ලද ආදායම සියයට 68.5 කින් වර්ධනය වීම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත බද්දෙන් ලද ආදායම, 2024 වසරේ පළමු මාස හතර තුළ දී සියයට 37.6 කින් ඉහළ ගියේය. බදු අනුපාත වැඩිවන ලෙස සංශෝධනය කිරීම සහ සීනි සහ අර්තාපල් මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ නැංවීම හේතුවෙන් ආනයන මත වූ බදු ආදායම සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. සැළකිය යුතු අයිතම ප්‍රමාණයකට බලපාන ලද සෙස් බදු සහ වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු ඉවත් කර තිබිය දී වුවද, ආනයන සීමා ක්‍රමානුකූලව ඉවත් කිරීම හේතුවෙන් සෙස් බද්දෙන් සහ වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් ලද ආදායම පිළිවෙළින් සියයට 64.3 කින් සහ සියයට 0.4 කින් වර්ධනය විය.

ප්‍රධාන වශයෙන්ම දඩ, ගාස්තු සහ අයකිරීම් මඟින් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ දී ලද බදු නොවන ආදායමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද බදු නොවන ආදායම රු. බිලියන 98.3 දක්වා සියයට 26.8 කින් වර්ධනය විය.

රාජ්‍ය වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 1,645.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,579.2 දක්වා සියයට 4.0 කින් අඩු විය. අයවැය හිඟය සහ තිරසර නොවන ණය මට්ටම් පියවා ගැනීම සඳහා ඉහළ රාජ්‍ය මූල්‍ය විනයක් ඇති කිරීම පිණිස රජය මඟින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද වියදම් කළමනාකරණ ක්‍රියාමාර්යන්හි බලපෑම මේ මඟින් පිළිබිඹු වේ.

2024 වසරේ පළමු මාස හතර තුළ සමස්ත රාජ්‍ය වියදමෙන් සියයට 90 ක් පමණ වූ පුනරාවර්තන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 1,485.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,419.3 දක්වා සියයට 4.4 කින් අඩු විය. මේ සඳහා 2023 වසරේ පළමු මාස හතර තුළ

රු. බිලියන 819.0 ක් වූ පොලී වියදම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 726.0 දක්වා සියයට 11.3 කින් අඩුවීම ප්‍රධාන වශයෙන්ම හේතු විය. දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) සම්පූර්ණ කිරීමේ බලපෑම සහ දේශීය පොලී අනුපාත පහත වැටීම දේශීය පොලී ගෙවීම් රු. බිලියන 692.1 දක්වා සියයට 12.3 කින් අඩු වීමට හේතු විය. කෙසේ වුවද, සමස්ත පොලී ගෙවීම්වලින් සියයට 4.7 ක් නියෝජනය කරනු ලබන විදේශීය පොලී ගෙවීම්, රු. බිලියන 34.0 දක්වා සියයට 13.9 කින් වැඩි විය.

වගුව **2.1 :** අයවැය සාරාංශය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| අයිතමය | 2023 | 2024 (තාවකාලික) |
|---|---|---|
| **ආදායම් හා ප්‍රදාන** | **821,346** | **1,218,065** |
| **ආදායම** | **820,070** | **1,216,030** |
| බදු ආදායම | 742,578 | 1,117,762 |
| බදු නොවන ආදායම | 77,493 | 98,268 |
| ප්‍රදාන | 1,276 | 2,035 |
| **වියදම** | **1,645,602** | **1,579,166** |
| **පුනරාවර්තන** | **1,484,984** | **1,419,264** |
| පොලී ගෙවීම් | 818,969 | 726,122 |
| අනෙකුත් | 666,015 | 693,142 |
| **රාජ්‍ය ආයෝජන** | **177,903** | **165,335** |
| අනෙකුත් | (17,285) | (5,433) |
| **ජංගම ගිණුමේ ශේෂය** | **(664,913)** | **(203,234)** |
| **ප්‍රාථමික ශේෂය** | **(5,287)** | **365,021** |
| **සමස්ත අයවැය හිඟය** | **(824,256)** | **(361,101)** |
| **මූල්‍යනය** | **824,256** | **361,101** |
| විදේශීය මූල්‍යනය | (77,498) | (7,449) |
| ණය ගැනීම් | 49,970 | 35,536 |
| ණය ආපසු ගෙවීම් | (127,468) | (42,986) |
| දේශීය මූල්‍යනය | 901,753 | 368,551 |
| ණය ගැනීම් | 6,045,994 | 3,098,450 |
| ණය ආපසු ගෙවීම් | (5,144,241) | (2,729,899) |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

කෙසේ වුවද, සහනාධාර සහ පැවරුම් මත වියදම් රු. බිලියන 274.0 සිට රු. බිලියන 291.5 දක්වා සියයට 6.4 කින් වැඩි වීම සහ භාණ්ඩ සහ සේවා මත වියදම් රු. බිලියන 88.7 සිට රු. බිලියන 99.8 දක්වා සියයට 12.5 කින් වැඩි වීම හේතුවෙන් පොලී නොවන පුනරාවර්තන වියදම් 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.1 කින් වර්ධනය විය. සේවක සංඛ්‍යාව ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ නව බඳවා ගැනීම් අත්‍යවශ්‍ය තනතුරුවලට පමණක් සීමා කිරීම හේතුවෙන් වැටුප් සහ වේතන 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 303.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 301.8 දක්වා සියයට දශම 0.5 කින් අඩු විය.

ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 160.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 159.9 දක්වා සියයට 0.4 කින් අඩු විය. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වන වියදම් සියයට 20.8 කින් ඉහළ ගොස් තිබිය දී වුවද, රාජ්‍ය ආයතන, පළාත් සභා සඳහා පැවරුම් සහ ශුද්ධ ණය ලබා දීමේ අඩුවීමක් මේ මඟින් සනිටුහන් විය.

වගුව **2.2 :** ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත (වාර්ෂික) | තත්‍ය (ජන.-අප්‍රේල්) (තාවකාලික) | සාධනය (%) |
|---|---|---|---|
| මුළු ආදායම | **4,107** | **1,216** | **29.6** |
| බදු ආදායම | 3,820 | 1,118 | 29.3 |
| බදු නොවන ආදායම | 287 | 98 | 34.2 |
| මුළු වියදම | **6,978** | **1,579** | **22.6** |
| වර්තන වියදම | 5,277 | 1,419 | 26.9 |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | 1,701 | 160 | 9.4 |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## 2.2 රාජ්‍ය ආදායම

බදු ආදායම රු. බිලියන 742.6 සිට රු. බිලියන 1,117.8 දක්වා සියයට 50.5 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන්ම හේතු කොට ගෙන, ප්‍රදාන රහිත වූ සමස්ත රාජ්‍ය ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 820.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,216.0 දක්වා සියයට 48.3 කින් වැඩි විය.

බදු ආදායම ඉහළ යාමට:

1) 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම, 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් වැඩි බහුතරයක් ඉවත් කිරීම සහ 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආනයන සියයට 9.5 කින් වැඩි වීම හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 89.5 කින් හෝ රු. බිලියන 199.7 කින් වැඩි වීම;

2) 2023 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලද, එහෙත් ආදායමෙහි වැඩි වීම් 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සිට පිළිබිඹු වූ බදු ප්‍රතිපත්ති සංශෝධනවල සම්පූර්ණ බලපෑම, රාජ්‍ය අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම (2024 පෙබරවාරි මාසයේ දී රාජ්‍ය අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් අනුපාත දර්ශකවල වාර්ෂික ලක්ෂ්‍යමය වැඩිවීම පිළිවෙළින් සියයට 10.6 සහ සියයට 7.1 ක් විය), සංස්ථාපිත සහ පුද්ගලික ආදායම බදු මත ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීමේ හා ආර්ථික වර්ධනයට නැවත එළඹීමේ බලපෑම හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 27.3 කින් හෝ රු. බිලියන 52.3 කින් වැඩිවීම;

3) 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඛනිජ තෙල් ආනයනය සියයට 14.4 කින් ඉහළ යාම සහ 2023 වසරේ ජූනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් සහ ඩීසල් මත බදු අනුපාත ලීටරයක් සඳහා රුපියල් 25 කින් වැඩි කිරීම හා 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩීසල් සඳහා ලීටරයකට රු. 6 කින් සහ පෙට්‍රල් සඳහා ලීටරයකට රු. 5 කින් අඩු කිරීම සමඟ නිෂ්පාදන බදු අනුපාතවල ශුද්ධ වැඩි වීම හේතුවෙන් ඛනිජ තෙල් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම සියයට 165.7 කින් හෝ රු. බිලියන 46.0 කින් වැඩි වීම;

4) සීනි සහ අර්තාපල් සඳහා කිලෝග්‍රෑමයකට රු. 50 ක් දක්වා බදු අනුපාත ඉහළ නැංවීම සහ ප්‍රධාන වෙළෙඳ භාණ්ඩවල ආනයන පරිමාව වැඩිවීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම සියයට 107.4 කින් හෝ රු. බිලියන 16.0 කින් වැඩි වීම;

5) 2023 වසරේ මාර්තු මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බදු අනුපාත සියයට 0:10:15 සිට සියයට 0:15:20 දක්වා ඉහළ නැංවීම සහ ආනයන වැඩිවීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම රු. බිලියන 13.9 සියයට 68.5 කින් වැඩි වීම;

6) 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම හේතුවෙන් බදු ගෙවන්නන් සංඛ්‍යාව වැඩි වීම සහ ආනයන වැඩිවීමේ බලපෑම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 19.3 කින් හෝ රු. බිලියන 13.5 කින් වැඩි වීම;

7) 2023 වසරේ ජූලි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු අනුපාත සංශෝධනවල සම්පූර්ණ බලපෑම, 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බද්ද උද්ධමනයට අනුකූලව දර්ශක ගත කිරීම සහ නිෂ්පාදන බදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීම සහ 2024 වසරේ ජනවාරි මස 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම හේතුවෙන් සුරා බද්දෙන් ලද ආදායම සියයට 20.6 කින් හෝ රු. බිලියන 12.0 කින් වැඩි වීම; සහ

8) ආනයනය වැඩිවීම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම සෙස් බද්ද සියයට 64.3 කින් හෝ රු. බිලියන 10.7 කින් වැඩි වීම හේතු විය.

2024 වසරේ පළමු මාස හතර තුළ දී බදු නොවන ආදායම සියයට 26.8 කින් හෝ රු. බිලියන 20.8 කින් ඉහළ යාම ද, ආදායම වැඩි වීම සඳහා දායක විය. පොලී ආදායම රු. බිලියන 11.5 කින් ද, දඩ, අයකිරීම් හා ගාස්තු මඟින් ලද ආදායම රු. බිලියන 8.6 කින් ද, ලාභ හා ලාභාංශ රු. බිලියන 3.7 කින් ද ඉහළ යාම මේ සඳහා හේතු විය.

වගුව **2.3 :** ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | තත්‍ය (ජන. – අප්‍රේල්) (තාවකාලික) |
|---|---|---|
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | |
| ආදායම් සහ ලාභ මත බදු | 1,080 | 244 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 740 | 242 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 195 | 63 |
| **උප එකතුව** | **2,015** | **549** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | |
| ආනයන බදු | 175 | 34 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 660 | 181 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 55 | 20 |
| වරාය ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 175 | 57 |
| සෙස් ආනයන / අපනයන | 60 | 27 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 95 | 31 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 313 | 128 |
| දුම්වැටි | 143 | 35 |
| ඛනිජ තෙල් | 135 | 74 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 35 | 19 |
| **උප එකතුව** | **1,533** | **478** |
| **සුරා බදු දෙපාර්තමේන්තුව** | | |
| මත්පැන්/දුම්කොළ | 232 | 71 |
| **උප එකතුව** | **232** | **71** |
| **අනෙකුත්** | | |
| විදුලි සංදේශ බද්ද | 19 | 6 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 22 | 13 |
| **උප එකතුව** | **40** | **20** |
| **මුළු බදු ආදායම** | **3,820** | **1,118** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### බදු ආදායම

රු. බිලියන 1,117.8 ක් වූ බදු ආදායම, ප්‍රදාන රහිත වූ රාජ්‍ය ආදායමෙන් සියයට 91.9 ක් විය. එකතු කළ අගය මත බද්දෙහි හා විදේශ වෙළෙඳාම මත බදුවලින් ලද ආදායමේ වර්ධනයත් සමඟ, බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සෘජු බදු ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ සියයට 25.8 ට සාපේක්ෂව, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 21.8 දක්වා අඩු විය. රු. බිලියන 3,820.0 ක් වූ ඇස්තමේන්තුවෙන් සියයට 29.3 ක බදු ආදායමක් 2024 වසරේ පළමු මාස හතර තුළ දී ළඟා කර ගන්නා ලදී.


වගුව **2.4 :** රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| අයිතමය | 2023 | 2024 | වර්ධනය % |
|---|---|---|---|
| බදු ආදායම | **742,578** | **1,117,762** | **50.5** |
| ආදායම් බදු | 191,768 | 244,048 | 27.3 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 314,848 | 412,799 | 31.1 |
| එකතු කළ අගය මත බදු | 158,181 | 242,116 | 53.1 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 54,396 | 63,244 | 16.3 |
| නිෂ්පාදන/සුරා බදු | 102,246 | 107,350 | 5.0 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 24 | 89 | 267.4 |
| ආනයන මත පදනම් වූ බදු | 223,414 | 441,019 | 97.4 |
| රේගු බදු | 20,264 | 34,137 | 68.5 |
| එකතු කළ අගය මත බදු | 65,007 | 180,768 | 178.1 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 148 | 2 | -98.4 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 56,685 | 56,892 | 0.4 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 14,872 | 30,846 | 107.4 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 15,456 | 20,075 | 29.9 |
| නිෂ්පාදන බදු | 34,318 | 90,922 | 164.9 |
| සෙස් | 16,663 | 27,376 | 64.3 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 12,548 | 19,896 | 58.6 |
| බදු නොවන ආදායම | **77,493** | **98,268** | **26.8** |
| මුළු ආදායම | **820,070** | **1,216,030** | **48.3** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**රූප සටහන 2.1:** රජයේ ආදායම් සංයුතිය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### ආදායම් බදු

2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට ප්‍රධාන වශයෙන්ම පුද්ගල ආදායම් බදු සහ සංස්ථාපිත ආදායම් බදු, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවාගැනීමේ බදු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම්වල පූර්ණ බලපෑම තහවුරු වීම හේතුවෙන් ආදායම් බදු මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතරේ දී වූ රු. බිලියන 191.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 244.0 ක් දක්වා සියයට 27.3 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. තවද, වැටුප් වැඩිවීම සහ දේපළ අංශයේ සිදුවූ අනෙකුත් ධනාත්මක වර්ධනයන් මෙන්ම බදු පරිපාලන ක්‍රියාමාර්ගයන් ගේ බලපෑම් ද මෙසේ ආදායම ඉහළ යාමට හේතුවිය.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතරේ දී වූ රු. බිලියන 40.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 65.0 ක් දක්වා සියයට 62.1 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. පොලිය මත රඳවාගැනීමේ බද්දෙන් ලැබුණු ආදායම ද රු. බිලියන 39.3 සිට රු. බිලියන 55.2 දක්වා සියයට 40.6 කින් වර්ධනය විය. එසේම පුද්ගල ආදායම් බද්ද මඟින් ලද ආදායම ද රු. බිලියන 7.4 සිට රු. බිලියන 11.2 දක්වා සියයට 51.6 කින් වර්ධනය වූ අතර සංස්ථාපිත බදු ආදායම ද රු. බිලියන 105.0 සිට රු. බිලියන 112.4 දක්වා සියයට 7.1 ක වර්ධනයක් පෙන්වීය. ආදායම් බදු මඟින් ලද ආදායම එකතු කිරීමේ කැපීපෙනෙන වර්ධනය උදෙසා රජය විසින් ගනු ලැබූ බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග බෙහෙවින් හේතුවිය.

**වගුව 2.5 :** ආදායම් බදු කාර්යසාධනය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| බදු පදනම | 2023 | 2024 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු | 111,843 | 123,591 | 10.5 |
| උපයන විට ගෙවීම් | 40,082 | 64,989 | 62.1 |
| පොළී ආදායම මත බදු | 39,301 | 55,250 | 40.6 |
| වෙනත් | 543 | 218 | (59.9) |
| **එකතුව** | **191,769** | **244,048** | **27.3** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

තනි පුද්ගල බදු ගෙවන්නන්ගේ ගනුදෙනු පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මූල්‍ය ආයතනවල බැඳීමක් ඇති කිරීම, පුද්ගල ආදායම් බදු ගෙවන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික බදු ගොනු ඇති කිරීම අනිවාර්යය කිරීම, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ වැඩිපුර ගෙවූ මුදල් ආපසු ගෙවීම කඩිනම් කිරීම, මුදලින් කෙරෙන ගනුදෙනු අධෛර්යමත් කිරීමේ අරමුණින් එක් දිනක් තුළදී හෝ තනි ගනුදෙනුවක දී හෝ එක් අවස්ථාවක දී හෝ රු. 500,000 හෝ ඊට වැඩි එකතුවක් ලෙස වන ගනුදෙනු බදු අරමුණු සඳහා වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදීම සහ රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිතිපතා තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රෙගුලාසියක් නිකුත් කිරීම ආදිය මේ යටතේ ගනු ලැබූ ක්‍රියාමාර්ග වේ.

### එකතු කළ අගය මත බද්ද

නාමික වශයෙන් ගත් කළ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 223.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 422.9 දක්වා සියයට 89.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, එය 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 30.2 ක ලඟා කර ගැනීමකි. 2024 වසරේ පළමු මාස හතර තුළ දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 242.1 දක්වා සියයට 53.1 කින් ද, ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 180.8 දක්වා සියයට 178.1 කින් ද වැඩිවිය. 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව අඩු කිරීම හා එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීමත් ආනයන සීමා කිරීම් ඉවත් කිරීම හා සමගාමීව ආනයන වර්ධනය වීමේ බලපෑමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**වගුව 2.6 :** එකතු කළ අගය මත බදු කාර්යසාධනය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා

රු. මිලියන

| බදු පදනම | 2023 | 2024 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| දේශීය | 158,181 | 242,116 | 53.1 |
| ආනයන | 65,007 | 180,768 | 178.1 |
| මුළු ආදායම | **223,189** | **422,884** | **89.5** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### නිෂ්පාදන බදු

ප්‍රධාන වශයෙන් ඛණිජ තෙල්, මත්පැන්, මෝටර් වාහන සහ අනෙකුත් නිෂ්පාදන බදු අයකළ හැකි අයිතමයන්ගෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් දුම්වැටිවලින් ලද ආදායම අඩු වුවද, නිෂ්පාදන බදුවලින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී උපයන ලද රු. බිලියන 136.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 198.3 ක් දක්වා සියයට 45.2 කින් ඉහළ ගියේය. වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 36.4 ක අගයක් ලඟාකර ගනිමින් නිෂ්පාදන බදු ආදායම, බදු ආදායමෙන් සියයට 17.7 කට මෙන්ම සමස්ත ආදායමෙන් සියයට 16.3 කට දායක විය.

2023 වසරේ ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන ලීටරයක් මත රු. 25 ක නිෂ්පාදන බද්දක් පැනවීම සහ 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ඩීසල් ලීටරයක් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද රු. 6 කින් සහ පෙට්‍රල් ලීටරයක් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද රු. 5 කින් අඩු කිරීම හේතුවෙන් ඉන්ධන සඳහා වූ නිෂ්පාදන බද්දේ ශුද්ධ වැඩිවීම හා ඉන්ධන කෝටා ක්‍රමය ඉවත් වීමත් සමඟ ආනයන වැඩිවීම හා 2024 වසරේ පළමු කාර්තුවේ වාර්තා වූ ආර්ථික වර්ධනයත් සමඟ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් ඛණිජ තෙල් නිෂ්පාදනවලින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 27.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 73.8 ක් දක්වා සියයට 165.7 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය.

මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 58.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 70.2 ක් දක්වා සියයට 20.6 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීමය. කෙසේ වෙතත්, සමස්ත මත්පැන් නිෂ්පාදනය 2023 වසරේ පළමු මාස හතර තුළ වූ නිරපේක්ෂ ලීටර් මිලියන 12.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ නිරපේක්ෂ ලීටර් මිලියන 10.7 දක්වා සියයට 11.1 කින් අඩු විය. සැර මත්පැන් මත නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 39.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 43.5 දක්වා සියයට 9.8 කින් වර්ධනය විය. එසේම, බීර මත නිෂ්පාදන බද්දෙන් එකතු කරන ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 17.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 25.2 ක් දක්වා සියයට 43.9 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2024 වසරේ පළමු මාස හතර තුළ මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම එකතු 2024 වසරේ ඇස්තමේන්තුගත මුළු ආදායමෙන් සියයට 30.5 ක ළඟා කර ගැනීමකි.

**වගුව 2.7 : නිෂ්පාදන බදු/සුරාබදු ආදායම් කාර්යසාධනය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා**

රු. මිලියන


| බදු පදනම | 2023 | 2024 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| මත්පැන් | 58,158 | 70,163 | 20.6 |
| දුම්වැටි හා දුම්කොළ | 42,706 | 34,961 | -18.1 |
| මෝටර් වාහන | 6,559 | 17,163 | 161.7 |
| ඛනිජ තෙල් | 27,759 | 73,759 | 165.7 |
| අනෙකුත් | 1,382 | 2,227 | 61.1 |
| **එකතුව** | **136,564** | **198,272** | **45.2** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

දේශීය වාහන එකලස් කිරීමේ කර්මාන්තය සඳහා දිරිගැන්වීමක් ලෙස අර්ධ වශයෙන් කොටස්වලට ගලවන ලද නවීන වාහන ආනයනය සඳහා පනවා තිබූ සීමා යම් තරමකට ලිහිල් කිරීම හේතුවෙන් මෝටර් වාහනවලින් ලද නිෂ්පාදන බදු 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා කළ රු. බිලියන 6.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 17.2 ක් දක්වා සියයට 161.7 කින් සීඝ්‍ර ලෙස ඉහළ ගියේය.

තවද, ආනයන සීමාවන් ලිහිල් කිරීමේ බලපෑම පිළිඹිබු කරමින් පැණි බීම, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල වැනි නිෂ්පාදන බදු අයකළ හැකි අයිතමයන්ගෙන් උපයාගත් නිෂ්පාදන බදු ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 1.4 ට සාපේක්ෂව 2024 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 2.2 දක්වා සියයට 61.2 කින් වැඩි විය.

**රූපසටහන 2.2: නිෂ්පාදන බදු කාර්යසාධනය 2023 සහ 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය අනුව දුම්වැටිවල මිල ගැලපීම සඳහා සියළුම දුම්වැටි වර්ගවලට අදාළ නිෂ්පාදන බද්ද 2024 වසරේ ජනවාරි

මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 14 කින් ඉහළ දැමුවද දුම්වැටිවලින් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා කළ රු. බිලියන 42.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 35.0 දක්වා සියයට 18.1 කින් පහළ ගියේය. බදු වැඩි වීමත් සමඟ දුම්වැටි මිල ඉහළ දැම්මේ ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පහත වැටීම (දිග මි.මී. 60 සිට මි.මී. 67 දක්වා කාණ්ඩයේ හැර) 2024 වසරේ පළමු මාස හතර තුළ දුම්වැටිවලින් ලද නිෂ්පාදන බදු ආදායම අඩුවීමට බලපාන ලදී.

### වෙනත් බදු

රේගු ආනයන බද්ද, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද, විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, විදුලි සංදේශ බද්ද සහ සෙස් බද්ද වැනි අනෙකුත් බදුවලින් උපයාගත් ආදායම, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා කරන ලද රු. බිලියන 191.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 252.6 ක් දක්වා සියයට 32.2 කින් වර්ධනය විය.

රේගු ආනයන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ රු. බිලියන 20.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 34.1 ක් දක්වා වර්ධනය වූ අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම සහ 2023 මාර්තු මාසයේ දී රේගු ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10 සහ සියයට 15 සිට සියයට 0, සියයට 15 සහ සියයට 20 දක්වා ඉහළ නැංවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය. 2023 වසරේ අප්‍රේල් මාසයේ දී අයිතම 1,631 ක් සහ 2024 වසරේ ජනවාරි මාසයේ දී අයිතම 26 ක් ක්‍රමානුකූලව ඉවත් කළ නමුදු, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන්, වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ රු. බිලියන 56.7 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 56.9 ක් දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස හතර තුළ දී උපයන ලද වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු ආදායම, 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 175 න් සියයට 32.5 ක් නියෝජනය කරයි. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් උපයන ලද ආදායම රු. බිලියන 30.8 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම සහ සීනි සඳහා බද්ද ඉහළ නැංවීම මෙයට හේතුවිය. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 83.3 ක් දක්වා සියයට 19.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. එසේම, විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 6.4 ක් දක්වා සියයට 20.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ රු. බිලියන 16.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 27.4 ක් දක්වා සියයට 64.3 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම මෙයට හේතුවිය. ඒ අනුව, ආනයන මත පනවන ලද සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ රු. බිලියන 16 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 26.7 ක් දක්වා සියයට 66.9 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. මේ අතර, විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමේ බලපෑම හේතුවෙන්, අපනයන මත පනවන ලද සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා වූ රු. බිලියන 0.70 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 0.69 ක් දක්වා සියයට 1.6 කින් සුළු වශයෙන් අඩු විය. 2024 වසරේ පළමු මාස හතර තුළ දී උපයන ලද සෙස් බදු ආදායම, 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 60.0 න් සියයට 45.6 ක් නියෝජනය කරයි.

### බදු නොවන ආදායම

බදු නොවන ආදායම, ප්‍රධාන වශයෙන් පොලී ආදායම සහ දඩ, ගාස්තු සහ අය කිරීම්වලින් ලැබෙන ආදායම වැඩිවීම හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 77.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 98.3 දක්වා සියයට 26.8 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ඒ අනුව, පොලී ආදායම ණය පොලී අනුපාත වැඩිවීම හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 3.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 14.5 දක්වා සියයට 372.9 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් පරිපාලනය කරන ලද ගාස්තු සහ අය කිරීම් වැඩි කිරීම හේතුවෙන් 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 39.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 48.3 දක්වා සියයට 21.8 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබෙන ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ ලද රු. බිලියන 11.3 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 12.5 දක්වා සියයට 10.9 කින් වැඩි වූ අතර, රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ ලැබීම් ද 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 9.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.2 දක්වා සියයට 38.4 කින් වැඩි විය. මේ අතර, කුලී ආදායමෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 1.3 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 2.4 දක්වා සියයට 78.2 කින් වැඩි විය. 2024 වසරේ පළමු මාස හතර තුළ ලද බදු නොවන ආදායම ඇස්තමේන්තුගත වාර්ෂික බදු නොවන ආදායම වූ රු. බිලියන 287.0 න් සියයට 34.2 ක ළඟා කර ගැනීමකි.

වගුව 2.8: රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය

රු.බිලියන

| අයිතමය | 2023 ජනවාරි-අප්‍රේල් | 2024 ඇස්තමේන්තුව | 2024[(අ)] ජනවාරි-අප්‍රේල් | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 191.8 | 1,080.0 | 244.0 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 22.6 ක් ලඟා කර ගනිමින් 2024 වසරේ මුල් මාස හතර තුළ ආදායම් බදු ආදායම සියයට 27.3 කින් ඉහළ ගොස් ඇත.<br>- 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සංශෝධනයන්හි සම්පූර්ණ බලපෑම 2024 වර්ෂයේ සම්පූර්ණ මාස හතර සඳහා ළඟා කර ගැනීම<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යාම හා ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. |
| එකතු කල අගය මත බද්ද | 223.2 | 1,400.0 | 422.9 | 2024 වසරේ පළමු මාස හතර තුළ එකතු කළ අගය මත බදු ආදායම සියයට 89.5 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, එකතු කළ අගය මත බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 30.2 ක් ලඟා කරගෙන ඇත.<br>- 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ දැමීම;<br>- 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත වූ බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව රුපියල් මිලියන 80 සිට රුපියල් මිලියන 60 දක්වා පහත දැමීම;<br>- 2024 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන අයිතමයන් සඳහා පැවති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් වැඩි බහුතරයක් අහෝසි කිරීම; සහ<br>- සමස්ත ආනයන සියයට 9.5 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන මෙම ආදායම් වැඩි වීම ළඟා කර ගෙන ඇත. |
| නිෂ්පාදන/සුරා බදු | 136.6 | 545.0 | 198.3 | 2024 වසරේ මුල් මාස හතර තුළ නිෂ්පාදන/ සුරා බදු මගින් ලද ආදායම රුපියල් බිලියන 198.3 දක්වා සියයට 45.2 කින් ඉහළ ගොස් ඇති අතර, නිෂ්පාදන බදු ආදායම වාර්ෂික ඇස්තමේනතුවෙන් සියයට 36.4 ක් ලඟාකරගෙන ඇත.<br>- 2023 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් සහ ඩීසල් සඳහා වන නිෂ්පාදන බද්ද ලීටරයකට රුපියල් 25 කින් ඉහළ දැමීම සහ 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් ලීටරයක් සඳහා නිෂ්පාදන බද්ද රුපියල් 5 කින් ද, ඩීසල් සඳහා එම අනුපාතය රුපියල් 6 කින් ද පහත දැමීම තුළින් සියළුම වර්ගයේ පෙට්‍රල් හා ඩීසල් ආනයන මත නිෂ්පාදන බදු අනුපාත ශුද්ධ වශයෙන් ඉහළයාම සහ ඛණිජ තෙල් ආනයන සියයට 14.4 කින් ඉහළ යාම හේතුවෙන් ඛණිජතෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම ඉහළයාම;<br>- විදේශගත ශ්‍රමිකයින් සඳහා විදුලි බලයෙන් ක්‍රියාකරන වාහන ආනයනය සඳහා අවසර දීම හා සමහර වාහන කාණ්ඩයන් ආනයනය සඳහා තාවකාලිකව පනවා තිබූ සීමා ලිහිල් කිරීම හේතුවෙන් වාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් මෝටර් රථවාහන සඳහා වූ නිෂ්පාදන බදු ආදායම ඉහළයාම;<br>- 2023 වසරේ ජූලි මස සිට ක්‍රියාත්මක වන පරිදි සුරාබදු සංශෝධනය කිරීමේ සමස්ත බලපෑම, උද්ධමනයට ගැලපෙන පරිදි සුරාබදු අනුපාත ගැලපීම සහ 2024 වසරේ ජනවාරි මස සිට සුරාබදු අනුපාත සියයට 14 කින් ඉහළ දැමීම මෙන්ම 2024 ජනවාරි 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම හේතුවෙන් මත්පැන් සඳහා වන සුරා බදු ආදායම ඉහළ යාම නිෂ්පාදන/සුරා බදු ආදායම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. |

රු.බිලියන

| අයිතමය | **2023**<br>ජනවාරි-අප්‍රේල් | **2024**<br>ඇස්තමේන්තුව | **2024**(අ)<br>ජනවාරි-අප්‍රේල් | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආනයන බදු | 20.3 | 175.0 | 34.1 | 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව, 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ආනයන බදු මගින් ලද ආදායම සියයට 68.5 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. ආනයන බදු ආදායම ඇස්තමේන්තුවෙන් සියයට 19.5 ක් ලඟාකරගෙන ඇත.<br>- 2023 වසරේ මාර්තු මස 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආනයන බදු අනුපාත සියයට 0, සියයට 10, සියයට 15 සිට සියයට 0, සියයට 15 හා සියයට 20 දක්වා සංශෝධනය කිරීම; සහ<br>- 2024 වසරේ පළමු මාස හතර තුළ ආනයනය සියයට 9.5 කින් ඉහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. |
| වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද | 56.7 | 175.0 | 56.9 | - වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු ක්‍රමිකව ඉවත් කිරීමේ එක් අදියරක් ලෙස 2023 වර්ෂයේ අප්‍රේල් හතර වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්දට යටත් වන අයිතමවලින් සියයට 20 ක් නිදහස් කිරීම; සහ<br>- 2024 වසරේ මාර්තු මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිංගප්පූරු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව සිංගප්පූරුවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ වර්ග 595 ක් වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දනේ ඉවත් කිරීම හා තවත් භාණ්ඩ වර්ග 3,117 ක් සඳහා සහනදායී අනුපාත හඳුන්වා දීම හමුවේ වුවද, වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු මගින් ලද ආදායම සියයට 0.4 කින් සුළු වශයෙන් ඉහළගොස් ඇත.<br><br>2024 වසරේ මුල් මාස හතර තුළ ඉහළ ගිය ආනයනයන් හී බලපෑම හේතුවෙන් වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු මගින් ලද ආදායම වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 32.5 ක් ලඟාකරගෙන ඇත. |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 14.9 | 95.0 | 30.8 | ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළයාම, අර්තාපල් සහ සීනි සඳහා වූ බදු අනුපාත ඉහළ දැමීම හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ හා සේවා බද්ද මගින් උපයන ලද ආදායම සියයට 107.4 කින් ඉහළගොස් ඇත.<br>අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 32.5 ක් ලඟාකරගෙන ඇත. |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 69.9 | 250.0 | 83.3 | 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වර්ෂයකට රුපියල් මිලියන 120 සිට වර්ෂයකට රුපියල් මිලියන 60 දක්වා පහත දැමීම නිසා බදු ගෙවන්නන් ප්‍රමාණය වැඩිවීම හා 2024 වසරේ පළමු මාස හතර තුළ ආනයන ඉහළයාම හේතුවෙන් 2024 වර්ෂයේ මුල් මාස හතර තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලද ආදායම සියයට 19.3 කින් ඉහළ ගොස් ඇත.<br><br>සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලත් ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 33.3 ක් ලඟාකරගෙන ඇත. |
| වෙනත් බදු | 29.4 | 100.0 | 47.4 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 47.4 ක් ලඟාකර ගනිමින්, පසුගිය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2024 වසරේ මුල් මාස හතර තුළ වෙනත් බදු මගින් ලද ආදායම සියයට 61.2 කින් ඉහළ ගොස් ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන්<br>- ආනයන ඉහළයාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 64.3 කින් වැඩිවීම;<br>- විදුලි සංදේශ බද්ද මගින් ලද ආදායම සියයට 20.7 කින් වැඩිවීම; සහ<br>- අනෙකුත් බදු මගින් ලද ආදායම සියයට 86.5 කින් වැඩිවීම හේතු විය. |

රු.බිලියන

| අයිතමය | 2023 ජනවාරි-අප්‍රේල් | 2024 ඇස්තමේන්තුව | 2024(අ) ජනවාරි-අප්‍රේල් | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| බදු නොවන ආදායම | 77.5 | 287.0 | 98.3 | පොලී ආදායම, දඩ, අයකිරීම් හා ගාස්තු, රාජ්‍ය ව්‍යාපාර මඟින් ලැබෙන ලාභ හා ලාභාංශ ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන බදු නොවන ආදායම් මඟින් ලද ආදායම සියයට 26.8 කින් සැළකියයුතු ලෙස ඉහළ ගොස් ඇත.<br><br>ඒ අනුව 2024 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම මඟින් ලද ආදායම 2024 වසරේ ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 34.2 ක් ලඟාකරගෙන ඇත. |
| එකතුව | **820.1** | **4,107.0** | **1,216.0** | |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**විශේෂ සටහන 2.1: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2024 වසරේ ජනවාරි සිට මැයි දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2024.04.01 | 2024.03.21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනය<br>- රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු නියම කිරීම. |
| 2024.06.06 | 2024.06.06 දිනැති අංක 2387/40 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී සත්‍ය සායි කරුණා නිලයම් පදනම අනුමත පුණ්‍ය ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම. |
| **2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත** | |
| 2024.01.12 | **2024.01.12 දිනැති අංක 2366/33 දරන ගැසට් නිවේදනය**<br>- 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ 5 වැනි වගන්තියට ආදේශ කිරීම සහ එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ව්‍යුහයන් සංශෝධනය කරමින් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම. |
| 2024.02.02 | **2024.02.02 දිනැති අංක 2369/42 දරන ගැසට් නිවේදනය**<br>- රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම. |
| 2024.04.22 | **2024.04.22 දිනැති අංක 2381/16 දරන ගැසට් නිවේදනය**<br>- 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සහ 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිංහල පරිවර්තන දෝෂ සංශෝධනය කිරීම. |
| 2024.05.29 | **2024.05.29 දිනැති අංක 2386/09 දරන ගැසට් නිවේදනය**<br>- රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම. |
| **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත** | |
| **2024.01.01** | **2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව (සංශෝධන) බදු පනත**<br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම. |
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2024.01.01 | 2023.12.19 දිනැති අංක 2363/22 දරන ගැසට් නිවේදනය<br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 ක් දක්වා වැඩි කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.01.01 | 2023 අංක 32 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br><br>- ප්‍රධාන අයිතම සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බොහොමයක් ඉවත් කිරීම. |
| 2024.01.01 | 2024 අංක 16 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br><br>- එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60ක් දක්වා අඩු කිරීම. |
| **නිෂ්පාදන බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය<br><br>- සුචිගත කිරීමක් මත ඒකක අනුපාත සහිත බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල නිෂ්පාදන බද්ද 14%කින් සංශෝධනය කිරීම සහ පෙට්‍රල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 5කින් සහ ඩීසල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 6කින් අඩු කිරීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2024.01.01 | සුරාබදු නිවේදන අංක 04/2023 (2023.12.31 දිනැති අංක 2364/35 දරන ගැසට් නිවේදනය)<br><br>- සුරාබදු සඳහා වාර්ෂික උද්ධමන ගැලපීමක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල මත්පැන් සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 01/2024 (2024.01.12 දිනැති අංක 2366/38 දරන ගැසට් නිවේදනය)<br><br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 02/2024 (2024.01.12 දිනැති අංක 2366/39 දරන ගැසට් නිවේදනය)<br><br>- සුරාබදු නිවේදන අංක 902 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2024.02.01 | සුරාබදු නිවේදන අංක 03/2024 (2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් නිවේදනය)<br><br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු ගාස්තු හඳුන්වා දීම. |
| **වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/37 දරන ගැසට් නිවේදනය<br><br>- 2023 වසරේ අයවැය යෝජනා අංක 34.6 අනුව වසර පහක් ඇතුලත වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බැවින් පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 26ක වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීම. (තීරු බදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීම) |
| 2024.03.29 | 2024.03.28 දිනැති අංක 2377/39 දරන ගැසට් නිවේදනය<br><br>- ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ (SLSFTA) විධිවිධාන අනුව, අයිතම 3,117ක් සඳහා සහනදායී මිල ගණන් යෙදීමට සහ සිංගප්පූරුවෙන් එම භාණ්ඩ ආනයනය කිරීමේදී භාණ්ඩ 595ක් නිදහස් කිරීමට. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2024.01.06 | 2024.01.04 දිනැති අංක 2365/50 දරන ගැසට් නිවේදනය<br><br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) ප්‍රකාශයට පත් කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්)- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2024.02.01 | 2024.01.12 දිනැති අංක 2366/34 දරන ගැසට් නිවේදනය<br><br>- වෙළඳපල අතරමැදියන් සහ වෙළඳපල ආයතන සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම් සංශෝධනය කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2024.01.06 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 06/2023 (2024.01.04 දිනැති අංක 2365/51 දරන ගැසට් නිවේදනය)<br><br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,222 ක රේගු ආනයන තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහනේ ( TLP) "6" කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් දෙවන වාරිකය ඉවත් කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2024.01.02 | 2024.01.02 දිනැති අංක 2365/04 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි මස 02 වැනි දින සිට 21 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම. |
| 2024.01.08 | 2024.01.07 දිනැති අංක 2365/84 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.02.20 | 2024.02.19 දිනැති අංක 2372/06 දරන ගැසට් නිවේදනය<br>- බඩ ඉරිඟු, උඳු සහ මුං ඇට ආනයනය මත පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීමටත්, එහිදී කව්පි සහ කුරක්කන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු.70/- සිට රු. 300/- දක්වා වැඩි කිරීම. |
| 2024.03.02 | 2024.03.01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනය<br>- 2024 අප්‍රේල් මස 11 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම. |
| 2024.03.27 | 2024.03.26 දිනැති අංක 2377/17 දරන ගැසට් නිවේදනය<br>- උත්සව සමය පිළිබඳ සලකා අනෙකුත් එළු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 10/ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ සහනදායී බදු අනුපාතයක් අය කිරීම සහ 2024.01.02 සිට 2024.01.21 දක්වා සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2024.01.11 | 2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.01.11 දිනැති අංක 2366/19 දරන ගැසට් නිවේදනය)<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ ආනයනය සඳහා ඉඩ සැලසීම. |
| 2024.02.07 | 2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.07 දිනැති අංක 2370/15 දරන ගැසට් නිවේදනය)<br>- 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිකුත් කරන ලද අංක 12(අ) රෙගුලාසිය (අංක 2312/78 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) සංශෝධනය කරමින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ලබා දෙන කාලය දීර්ඝ කිරීම. |
| 2024.02.19 | 2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.19 දිනැති අංක 2372/04 දරන ගැසට් නිවේදනය)<br>- අනුමත කරන ලද ව්‍යවසායයන් විසින් සකස් කිරීම සහ ප්‍රතිඅපනයන කිරීමේ අරමුණ සඳහා තෝරාගත් කුළුබඩු (උදා:- ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසි ආදී) ආනයනයට ඉඩ සැලසීම. |
| 2024.02.29 | 2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.28 දිනැති අංක 2373/28 දරන ගැසට් නිවේදනය)<br>- ගෙවීම මත ලේඛන (DP) සහ පිළිගැනීම මත ලේඛන (DA) යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනයට පූර්ව අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කරමින්, ආනයන සහ අපනයන (පාලන) අංක 6 රෙගුලාසිය ඉවත් කිරීම. |
| 2024.03.19 | 2024 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.03.19 දිනැති අංක 2376/14 දරන ගැසට් නිවේදනය)<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ ආනයනය සඳහා ඉඩ සැලසීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.04.08 | 2024 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.04.08 දිනැති අංක 2379/03 දරන ගැසට් නිවේදනය)<br>- රෙගුලාසිවල V වන උපලේඛනයේ ලැයිස්තුගත කර වර්ගීකරණය කර ඇති මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,000ක් සඳහා පමණක් වූ උඳු ආනයනය කිරීමට ආනයන බලපත්‍ර රෙගුලාසි පැනවීම. |
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2024.02.01 | 2024.02.01 දිනැති අංක 2369/27 දරන ගැසට් නිවේදනය<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොලින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, අදාළ වන අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60ත් ඇ.එ.ජ. ඩොලර් 30ක සහනදායී අනුපාතයක් ලබාදීම වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම. |
| 2024.03.07 | 2024.03.06 දිනැති අංක 2374/19 දරන ගැසට් නිවේදනය<br>- 2024 මාර්තු මස 07 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර තුනක පමණ කාලයක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 60/-ක බද්ද වෙනුවට, මඟී යාත්‍රා ප්‍රවාහනය මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 5/-ක් ලෙස සහනදායී අනුපාතයක් සහ මඟී නෞකාවක් මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 20/-ක් ලෙස සහනදායී අනුපාතයක් ප්‍රදානය කිරීම. |
| **මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2024.01.24 | 2024.01.24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය<br>- 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය තව දුරටත් දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා වැඩි කිරීම.) |

## 2.3 රාජ්‍ය වියදම

රාජ්‍ය වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 1,645.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 1,579.2 දක්වා සියයට 4.0 කින් අඩු විය. ප්‍රධාන වශයෙන් පොලී වියදම් අඩුවීම හේතුවෙන් පුනරාවර්තන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 1,485.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,419.3 දක්වා සියයට 4.4 කින් අඩු විය. ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 160.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 159.9 දක්වා සියයට 0.4 කින් අඩු විය.

### පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය ඇතුළත්ව පොලී ගෙවීම් සඳහා සමස්ත වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 819.0 ට සාපේක්ෂව 2024 වසරේ ඊට සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 726.1 ක් දක්වා සියයට 11.3 කින් අඩු විය. මේ සඳහා දේශීය ණය පොලී ගෙවීම් 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 789.1 සිට 2024 වසරේ ඊට සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 692.1 ක් දක්වා සියයට 12.3 කින් අඩු වීම හේතු විය. කෙසේ වුවද, විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම්, 2023 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 29.8 ට සාපේක්ෂව 2024 වසරේ ඊට සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 34.0 දක්වා සියයට 13.9 කින් වැඩි විය.

**වගුව 2.9 : 2024 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ වියදම් හා කාර්යසාධනය**

රු.මිලියන

| අයිතමය | 2023 | 2024 (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,484,984** | **1,419,264** |
| වැටුප් | 303,310 | 301,811 |
| විශ්‍රාම වැටුප් | 105,924 | 123,643 |
| පොලී ගෙවීම් | 818,969 | 726,122 |
| වෙනත් | 256,781 | 267,688 |
| **ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්** | **160,618** | **159,902** |
| **එකතුව** | **1,645,602** | **1,579,166** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### වැටුප් හා විශ්‍රාම වැටුප්

පළාත් සහා ඇතුළු රාජ්‍ය සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා දරන ලද වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 303.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 301.8

දක්වා සියයට 0.5 කින් අඩු විය. සේවක සංඛ්‍යා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ අත්‍යවශ්‍ය බඳවාගැනීම් සඳහා පමණක් රාජ්‍ය සේවයට පුද්ගලයින් බඳවාගැනීම සීමා කිරීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

කෙසේ වුව ද, හිඟ මුදල් පියවීමෙන් නියමිත වේලාවට පාරිතෝෂික ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සඳහා වන වියදම 2023 වසරේ පළමු මාස හතර තුළ දී රු. බිලියන 105.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 123.6 දක්වා සියයට 16.7 කින් වැඩි විය.

### සුබසාධන වියදම්

2024 වසරේ පළමු මාස හතර තුළ දී අස්වැසුම වැඩසටහනට අදාළ ගෘහස්ථ සහනාධාර, වයස අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන් සඳහා වන දීමනා, වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර, ආබාධිත පුද්ගලයන් සඳහා දීමනා, විවිධ හැකියා සහිත සෙබළුන්ට ආධාර, ගැබිණි මව්වරුන්ට ආහාර පැකේජ, පොහොර සහනාධාර, පාසල් නිල ඇඳුම් සහ පෙළ පොත් ආදිය ඇතුළත් සමාජ සුබසාධන සහ සමාජ ආරක්ෂණය සඳහා රජය විසින් රු. බිලියන 152.8 ක් වැය කරන ලදී.

2024 වසරේ පළමු මාස හතර තුළ දී අස්වැසුම සඳහා ලබා දෙන සමාජ ආරක්ෂණ වියදම් සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදෙන මුදල් ප්‍රදානයන් සඳහා දරන ලද වියදම රු. බිලියන 46 කි. අස්වැසුම සහ අනෙකුත් වර්ගීකරණ කුටුම්භ මුදල් ප්‍රදාන සඳහා 2024 වසර වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම රු. බිලියන 205 කි.

රජයේ රෝහල්වලට වෛද්‍ය සැපයුම් ඇතුළු සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සඳහා 2024 වසරේ පළමු මාස හතර තුළ දී වියදම රු. බිලියන 14.4 කි. තවද, නොමිලේ පෙළපොත්, නිල ඇඳුම් සහ දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් වැනි අධ්‍යාපනය පිළිබඳ සුබසාධන වැඩසටහන් සඳහා 2024 වසරේ පළමු මාස හතර තුළ දී දරන ලද වියදම රු. බිලියන 3.8 කි. රසායනික පොහොර සඳහා වසරේ මුල් මාස හතර තුළ රජය විසින් රු. බිලියන 12.5ක් වැය කර ඇත.

වගුව 2.10: **2024 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා ප්‍රධාන සුබසාධන වැඩසටහන් සඳහා වියදම්**

රු. මිලියන

| වැඩසටහනේ නම | 2024 (තාවකාලික) |
|---|---|
| **සමාජ සුභසාධනය** | |
| අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආධාර | 41,289.30 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර | 1,260 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර | 2820 |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | 591 |
| රණවිරු මාපිය රැකවරණ දීමනාව | 715.9 |
| ගංවතුර හා නියං සහනාධාර | 32.9 |
| පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 23 |
| මියගිය හා තුවාල ලැබූ සොල්දාදුවන් සඳහා සේවා වන්දී | 3,941 |
| **සෞඛ්‍ය හා පෝෂණ** | |
| ත්‍රිපෝෂ වැඩසටහන | 490 |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ල | 1,564 |
| පාසල් පෝෂ්‍යදායි ආහාර වැඩසටහන | 3,182 |
| පෙර පාසල් ළමුන් සඳහා උදය ආහාරය | 135 |
| රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් සමඟ) | 13,476.8 |
| **අධ්‍යාපනය** | |
| පාසල් පෙළ පොත් | 2,579 |
| පාසල් නිල ඇඳුම් | 997 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන් | 200 |
| ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන් | 1,000 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර | 1,000 |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ලැප්ටොප් පරිගණක හා වයිෆයි පහසුකම් සඳහා පොළී සහනාධාර | 0.057 |

රු. මිලියන

| වැඩසටහනේ නම | 2024 (තාවකාලික) |
|---|---|
| රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | 685 |
| දහම් පාසල් ශිෂ්‍යයින් සඳහා පෙළපොත් | 14.75 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 8.68 |
| **සහනාධාර** | |
| පොහොර සහ බෝග සහනාධාර | 12,816 |
| **වෙනත් සහනාධාර** | |
| ආදායම් නොලවන මාර්ගවල බස් රථ ධාවනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලබාදෙන සහනාධාර පාසල් වාර ප්‍රවේශපත්‍ර හා සන්නද්ධ හමුදා නිදහස් ගමන් කාර ප්‍රවේශපත්‍ර | 4,026 |
| **එකතුව** | **91,995.30** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## පාසල් අධ්‍යාපනය

2024 වසරේ පළමු මාස හතර තුළ පාසල් අධ්‍යාපනය සඳහා රු. මිලියන 99,373 ක මුදලක් වැය කර ඇති අතර එයින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙළින් රු. මිලියන 97,214 ක් සහ රු. මිලියන 2,159 ක් විය. 2024 වසරේ පළමු මාස හතර තුළ දී 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 4 කින් අඩු වී ඇත.

රජය විසින් 2024 වසරේදී පාසල් පෝෂණ ආහාර වැඩසටහන, පාසල් පෙළ පොත් මුද්‍රණය සහ පාසල් නිල ඇඳුම්, දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් ලබා දීම වැනි සුබසාධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා රජය විසින් එක් සිසුවකුගේ පෝෂණීය ආහාර වේලක් සඳහා වන දිනක මිල රු. 85 සිට රු. 110 ක්වා වැඩි කළ අතර මේ සඳහා 2024 වසරේදී රු. මිලියන 3,419 ක් වැය කරන ලදි. 2024 වසරේ පළමු මාස හතර තුළ දී පාසල් පෝෂණ ආහාර වැඩසටහන, පෙළ පොත් මුද්‍රණය සහ පාසල් නිල ඇඳුම් සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 6,994 කි. කෙසේ වුව ද, 2024 වසරේ පළමු මාස හතර තුළ දී මෙම සුබසාධන වැඩසටහන් සඳහා දරන ලද මුළු වියදම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 30 කින් පමණ අඩු විය. ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වශයෙන් පාසල්වල පුනරුත්ථාපන/යටිතල පහසුකම් සංවර්ධනය, පළාත් අධ්‍යාපන අංශය ඇතුළු ගුණාත්මක සංවර්ධන ප්‍රතිසංස්කරණ සඳහා වැය කෙරිණි.

වගුව 2.11 2024 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්

රු. මිලියන

| විස්තරය | 2023 (ජන-අප්‍රේල්) | 2024 (ජන-අප්‍රේල්) (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි | 83,909 | 87,529 |
| ජාතික | 17,669 | 19,379 |
| පළාත් | 66,240 | 68,150 |
| සුභසාධන වැඩසටහන් | 9,969 | 7,350 |
| විභාග ඇගයීම් කටයුතු | 649 | 1,292 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය | 377 | 121 |
| ගුරු සංවර්ධනය | 12 | – |
| විශේෂ අධ්‍යාපන සංවර්ධනය | 2 | – |
| පළාත් අධ්‍යාපනය | 981 | 654 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### උසස් අධ්‍යාපනය

2023 වසරේ පළමු මාස හතරට සාපෙක්ෂව 2024 වසරේ පළමු මාස හතර තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන වියදම රු. මිලියන 26,845 ක් දක්වා සියයට 10.4 කින් වැඩි විය. පුනරාවර්තන වියදම 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. මිලියන 21,847 දක්වා සියයට 13.7 කින් වැඩි විය. ප්‍රාග්ධන වියදම 2023 වසරෙ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේය තුළ දී රු. මිලියන 4,998 දක්වා සියයට 2.2 කින් අඩු විය.

**වගුව 2.12: 2024 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම**

රු. මිලියන

| විස්තරය | 2023 ජනවාරි - අප්‍රේල් | 2024 ජනවාරි - අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම** | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම | 16,796 | 17,769 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම | 716 | 1,000 |
| **මූලධන වියදම** | | |
| උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 967 | 597 |
| විද්‍යා සහ තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ආසියානු සංවර්ධන බැංකුව) | 1,286 | 824 |
| වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - සවුදි රජය) | 342 | 61 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන

2024 වසරේ පළමු මාස හතර තුළ දී නිපුණතා සංවර්ධනය සහ වෘත්තීය අධ්‍යාපනය සඳහා රු. මිලියන 2,790 ක් වැය කරන ලද අතර ඉන් රු. මිලියන 2,623 ක් ප්‍රාග්ධන වියදම් සහ රු. මිලියන 167 ක් පුනරාවර්තන වියදම් සඳහාද දරන ලදී.

**වගුව 2. 13 : 2024 ජනවාරි - අප්‍රේල් දක්වා නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් කරන ලද වියදම**

රු.මිලියන

| විස්තරය | 2023 ජනවාරි - අප්‍රේල් | 2024 ජනවාරි - අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| "නිපුණතා සිසු දිරිය" ශිෂ්‍යාධාර වැඩසටහන | 194 | 45 |
| නිපුණතා සංවර්ධන වැඩසටහන (ආසියානු සංවර්ධන බැංකුව/ලෝක බැංකුව) | 152 | - |
| තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල 7ක් නවීකරණය කිරීම | - | 78 |
| ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/කොයිකා) | 48 | 2 |
| යූ ලීඩ් (ශ්‍රී ලංකා රජය - USAID) | - | 3 |
| ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ලබා දීම (ශ්‍රී ලංකා රජය - GIZ) | - | 3 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### පර්යේෂණ හා නව නිපැයුම්

2024 වසරේ පළමු මාස හතර තුළ දී පර්යේෂණ හා නව නිපැයුම් සඳහා රු. මිලියන 335.5 ක සමස්ත වියදමක් දරන ලද අතර එයින් පිළිවෙළින් රු. මිලියන 335.0 ක් පුනරාවර්තන වියදම් සඳහා ද රු. මිලියන 0.5 ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද දරන ලදී.

**වගුව 2. 14 : 2024 ජනවාරි - අප්‍රේල් දක්වා පර්යේෂණ හා නව නිපැයුම් ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් කරන ලද වියදම**

රු.මිලියන

| විස්තරය | 2023 ජනවාරි - අප්‍රේල් | 2024 ජනවාරි - අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|
| තිසරු පස වැඩි දියුණු කිරීම | - | 2 |
| විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන | 2 | - |
| ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය ගිවිසුම් සහ අනෙකුත් රටවල් සමඟින් විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය | - | 2 |
| පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම | - | 1 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### සෞඛ්‍ය

පළාත් සභා සහ මධ්‍යම රජයේ සෞඛ්‍ය සඳහා වන වියදම ද ඇතුළත්ව 2024 වසරේ පළමු මාස හතර තුළ දී බටහිර සහ දේශීය වෛද්‍ය අංශවලින් සමන්විත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන රජයේ මුළු වියදම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. මිලියන 98,881 ක් දක්වා සියයට 20 කින් අඩු විය. සෞඛ්‍ය සඳහා වන මුළු වියදමෙන් රු. මිලියන 92,526 ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර ප්‍රාග්ධන ආයෝජනය රුපියල් මිලියන 6,355 කි. පුනරාවර්තන වියදම් සැලකීමේ දී එහි ප්‍රධාන කාණ්ඩයක් වන වෛද්‍ය සැපයුම් සංරචකය යටතේ ඖෂධ, ශල්‍ය වෛද්‍ය උපකරණ සහ රසායනාගාර අයිතමයන් සඳහා රුපියල් මිලියන 13,476 ක් වැය කර ඇත.

වගුව 2.15: 2024 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම

රු. මිලියන

| විස්තරය | 2023 ජන-අප්‍රේල් | 2024 (තාවකාලික) |
|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම්** | **117,215** | **92,526** |
| සේවා සැපයීමේ වියදම් | 47,483 | 69,190 |
| එයින්; වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 38,620 | 55,714 |
| වෛද්‍ය සැපයීම් | 41,146 | 13,476 |
| පළාත් සෞඛ්‍ය | 28,586 | 23,336 |
| **රාජ්‍ය ආයෝජන වියදම** | **6,446** | **6,355** |
| වෛද්‍ය උපකරණ | 560 | 214 |
| සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ඒ.ඩී.බී. | 155 | 929 |
| කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 174 | 842 |
| රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල හදිසි අනතුරු ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම. | 137 | - |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහල ගුණාත්මකභාවයකින් යුත් අධි ශක්ති විකිරණ ප්‍රතිකාර ලබාදීම | 53 | - |
| හෙද පීඨය/ නේවාසිකාගාරය ඉදිකිරීම | 23 | 83 |
| රාජ්‍ය ආයෝජන වියදම - වෙනත් | 3,244 | 2,991 |
| පළාත් සෞඛ්‍ය ආයෝජන | 2,100 | 1,296 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### කෘෂිකර්මය

වැවිලි, පශු සම්පත්, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන්ද ඇතුළත්ව කෘෂිකර්ම අංශය සඳහා 2023 වසරේ පළමු මාස හතරක කාල සීමාව තුළ දරා ඇති වියදම වන රු. මිලියන 25,071 ට සාපේක්ෂව එම අංශ සඳහා 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී දරා ඇති වියදම රු. මිලියන 33,245 දක්වා සියයට 33 කින් වැඩි විය. මෙයින් රු. මිලියන 12,452 ක් පොහොර සහනාධාර වැඩසටහන සඳහා ද, රු. මිලියන 183 ක් කෘෂි භෝග සඳහා ද, රු. මිලියන 791 ක් වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද, රු. මිලියන 831 ක් ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද, රු. මිලියන 338 ක් ඉඩම් සංවර්ධනය සඳහා ද, ඉතිරිය පශු සම්පත් සංවර්ධනයට සහ කෘෂිකර්ම අංශයට අවශ්‍ය පහසුකම් සැලසීම උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ද වැය කර ඇත.

### ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

සුරක්ෂිත පානීය ජලය සහ ගුණාත්මක සනීපාරක්ෂක සේවා ලබා ගැනීම සඳහා දේශීය හා විදේශීය බැංකුවලින් ලබා ගත් ණය සේවාකරණය ඇතුළුව රු. මිලියන 6,267 ක වියදමක් 2024 වසරේ පළමු මාස හතරක කාලය තුළ රජය විසින් දරා ඇත. එයින් රු. මිලියන 411 ක් හා රු. මිලියන 5,856 ක් පිළිවෙළින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. සමස්ත ජනගහනය සඳහාම සුරක්ෂිත පානීය ජලය සඳහා වන ප්‍රවේශය සහතික කිරීම පිණිස නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, නව ජල සම්පාදන යෝජනා ක්‍රම ස්ථාපනය සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීමේ අරමුණු ඇතිව ධාරිතා වැඩි දියුණු කිරීම් හා බෙදාහරීම පුළුල් කිරීමේ වැඩසටහන 2024 වසරේත් ක්‍රියාත්මක වේ.

### මාර්ග හා පාලම්

2024 වසරේ පළමු මාස හතර තුළ දී මාර්ග හා පාලම් සඳහා දරන ලද වියදම රු. මිලියන 78,910 ක් වූ අතර එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපෙක්ෂව යම් තරමක අඩු වීමකි. මෙම වසරේ පළමු කාර්තුව තුළ රජය දැනට පවතින මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සහ දැනටමත් ආරම්භ කර ඇති ව්‍යාපෘතිවල තීරණාත්මක ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඒවා රථවාහන ගමනාගමනය සුදුසු මට්ටමකට වැඩිදියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. මුළු වියදමින් රු. මිලියන 17,147 ක් ජාතික හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා වැය කර ඇත. මේ යටතේ රු. මිලියන 1,772 ක මුදලක් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ඉතිරි සංවර්ධන කටයුතු සඳහා වැය කර ඇති අතර ප්‍රධාන මාර්ගවලට ප්‍රවේශවීම සඳහා කි.මී. 100,000 ක විකල්ප මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 6,419 ක වියදමක් දරා ඇත. මාර්ග නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 4,689 ක් වැය කර ඇත.

අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා දරන ලද වියදම රු. මිලියන 15,874 ක් වූ අතර එයින් සැලකිය යුතු ප්‍රමාණයක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත.

මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වියදම රු. මිලියන 283 ක් වූ අතර පාලම් සංවර්ධනය හා ගුවන් පාලම් ඉදිකිරීම සඳහා වැය වූ මුදල රු. මිලියන 716 කි.

එමෙන්ම, මාර්ග පිළිසකර කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකුවලින් ලබා ගත් ණය සහ අදාළ පොළී වශයෙන් රු. මිලියන 41,622 ක් ගෙවා ඇති අතර සමස්ත වියදමෙන් විශාල ප්‍රමාණයක් මේ සඳහා දරා ඇත.

**වගුව 2.16: 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාර්ග සහ පාලම් සඳහා වියදම්**

රු.මිලියන

| | ව්‍යාපෘතිය /වැඩසටහන | 2023 ජනවාරි-අප්‍රේල් | 2024 ජනවාරි-අප්‍රේල් (තාවකාලික) |
|---|---|---|---|
| 1 | **අධිවේගී මාර්ග සංවර්ධනය** | **17,766** | **15,874** |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 13,933 | 12,015 |
| | කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය | 10 | 1,722 |
| | කණු මත දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය | 13 | - |
| | කණු මත දිවෙන වරාය නගර අධිවේගී මාර්ගය | 1,965 | 1,637 |
| | දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | 1,745 | 500 |
| 2 | **මාර්ග සංවර්ධනය** | **17,845** | **17,147** |
| | මාර්ග නඩත්තුව හා වැඩිදියුණු කිරීම් | 1,434 | 4,689 |
| | කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 276 | 639 |
| | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 316 | - |
| | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | 4,034 | 1,772 |
| | මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | 15 | - |
| | අන්තර්ගතිකව සහසම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය | 1,740 | 1,469 |
| | ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම | 8,269 | 6,419 |
| | අනෙකුත් මාර්ග සංවර්ධනය | 1,733 | 2,031 |
| 3 | **මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම** | 511 | 283 |
| 4 | **පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම** | **941** | **716** |
| | ජාතික මාර්ග ජාලයේ හානි වූ සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය | 130 | 81 |
| | පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 125 | 74 |
| | දෙවන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 2 | - |
| | කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් සැලසුම්කොට ඉදිකිරීම | 115 | 43 |
| | කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල සහ උත්තරානන්ද මාවතෙහි දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම | 559 | 418 |
| | ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම | 10 | 100 |
| 5 | **"මග නැගුම " ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන** | **1,080** | **648** |
| 6 | **මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාරු කිරීම්** | **3,000** | **-** |
| 7 | **ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති )** | **623** | **2,620** |
| 8 | **මාර්ග සංවර්ධය අධිකාරියේ මූල්‍ය හිඟය පියවීම සඳහා ලබාදුන් මූල්‍ය දායකත්වය** | **39,960** | **41,622** |
| 9 | **අනෙකුත්** | **-** | **-** |
| | **එකතුව** | **81,626** | **78,910** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### ප්‍රවාහන

2023 වසරේ පළමු මාස හතර තුළ දී ප්‍රවාහන අංශය වසින් දරන ලද සමස්ත වියදමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී දරන ලද වියදම රු. මිලියන 17,721 දක්වා සියයට 8.1 කින් අඩු විය. එයින් රු. මිලියන 13,254 ක් හා රු. මිලියන 4,467 ක් පිළිවෙළින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කටයුතු කිරීම සහ දුම්රිය ඇණියේ සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාව යන ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 2,145 ක වියදමක් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දරන ලදී.

පළමු මාස හතර තුළ දී මෙම අංශයට රජය විසින් දරන ලද සමස්ත වියදමින් රු. මිලියන 4,046 ක් ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ගයන්හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ සේවාවන්ට බස් ගමන් අවසර පත් ලබා දීම යන සුභසාධක සේවාවන් සඳහා වැය කර ඇත. එසේම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 866 ක වියදමක් දරන ලදී.

### නිවාස සංවර්ධනය

ගැටුම්වලින් පීඩාවට පත් වූ පවුල් නැවත පදිංචි කිරීම/ස්ථිර නිවාස ලබා දීම හා අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා චීන ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 2,000 ක් ඉදිකිරීම ද ඇතුළුව 2024 වසරේ පළමු මාස හතර තුළ නිවාස ඉදිකිරීම හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වෙනුවෙන් රජය විසින් රු. මිලියන 36 ක් වැය කර ඇත.

### නාගරික සංවර්ධනය

2024 වසරේ පළමු මාස හතර සඳහා නාගරික සංවර්ධනය වෙනුවෙන් රජය විසන් රු. මිලියන 1,116 ක් වැය කර ඇත. එයින් රු. මිලියන 97 ක් පුනරාවර්තන වියදම් ලෙසත් රු. මිලියන 1,069 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් වැය කර ඇත. නාගරික අංශයේ මුළු වියදමින් රු. මිලියන 345 ක් කොළඹ නාගරික සංවර්ධනය ව්‍යාපෘතිය, නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය, උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (යාපනය) සහ "සියක් නගර " වැඩසටහන යන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර ඇත. රු. මිලියන 596 ක් වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර ඇත.

### අපද්‍රව්‍ය කළමනාකරණය

2024 වසරේ පළමු මාස හතර තුළ දී අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඉඩම් වැඩි දියුණු කිරීම සඳහා රු. මිලියන 684 ක් වැය කරන ලදී. ඉන් රු. මිලියන 596 ක් වැය කර ඇත්තේ වේරැස් ගඟේ වැසි ජලාපවාහන සහ පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහායි.

### පරිසරය

2024 වසරේ පළමු මාස හතර තුළ පාරිසරික අංශය සඳහා රජය විසින් දරන ලද සමස්ත වියදම රු. මිලියන 2,519 ක් වන අතර, එයින් රු. මිලියන 2,374 ක් පුනරාවර්තන වියදම් සහ රු. මිලියන 145 ක ප්‍රාග්ධන වියදම් වේ. මුළු වියදමෙන් රු. මිලියන 30 ක් පරිසර සංරක්ෂණයටත්, රු. මිලියන 75 ක් වන ආවරණය පුළුල් කිරීම සහ වන ආරක්ෂණය සඳහාත්, රු. මිලියන 95 ක් විදුලි වැට ඉදිකිරීම ඇතුළු අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහාත්, රු. මිලියන 11 ක් සත්වෝද්‍යාන සංවර්ධනයටත් ලබා දී ඇති අතර, ඉතිරි මුදල පරිසරය සුරැකීම, වනජීවී සහ වන සංරක්ෂණය සම්බන්ධ වෙනත් වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත වෙන් කරන ලදී.

### වාරිමාර්ග හා ජල කළමනාකරණ

2024 වසරේ පළමු මාස හතර තුළ වාරිමාර්ග හා ජල කළමනාකරණය සඳහා වන මුළු ආයෝජනය රු. මිලියන 7,712 ක් වූ අතර මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා රුපියල් මිලියන 2,853 ක් වැය කර ඇත. ඉතිරිය රුපියල් මිලියන 4,359 ක් වාරිමාර්ග පද්ධති සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වෙන් කරන ලදී.

## 2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2024 වසරේ පළමු මාස හතර තුළ භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලාඒම් රුපියල් බිලියන 1,205.1 ක් වූ අතර එය රුපියල් බිලියන 1,116.1 ක ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 107.9 කි. මේ අතර 2024 වර්ෂයේ මුල් මාස හතර තුළ පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලායාම් රුපියල් බිලියන 1,608.5 ක් වූ අතර එය රුපියල් බිලියන 1,719.8 ක් වූ ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 93.5 කි. ඒ අනුව, පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන යන දෙවර්ගය සඳහා මුළු මුදල් ගලායාම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රුපියල් බිලියන 1,619.7 සමඟ සැසඳීමේදී සියයට 0.7 ක අඩුවීමක් පෙන්නුම් කරයි.

2024 වසරේ අප්‍රේල් මස 30 වන දිනට මුළු මුදල් හිඟය රුපියල් බිලියන 403.4 ක් වූ අතර එය 2023 වසරේ අප්‍රේල් මස 30 දිනට පැවති රුපියල් බිලියන 837.7 ක හිඟයට සාපේක්ෂව සියයට 51.8 කින් අඩු වූ අතර, මෙයට ප්‍රධාන වශයෙනම හේතු වුයේ අදායම හා වෙනත් ලැබීම් සියයට 54.1 කින් වැඩිවීමයි. පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන යන දෙඅංශය සඳහා වන මුළු මුදල් ගලායාම පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට වඩා සැළකිය යුතු විචලනයක් පිළිබිඹු නොකළද, අතිරික්ත ආදායම හරහා ණය සේවා ගෙවීම්වලින් කොටසක් මූල්‍යකරණය

කිරීම සහ පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ශුද්ධ මුදල් අතිරික්තය හේතුවෙන් සමස්ත ණය ගැනීම් පෙර වසරේ මෙම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 42.5 කින් අඩු වී ඇති අතර ණය ආපසු ගෙවීම පෙර වසරට වඩා සියයට 6.4 ක ආන්තික අඩුවීමක් පෙන්නුම් කරයි. ඒ අනුව, 2023 වසරේ අප්‍රේල් මස 30 දිනට පැවති ඍණ මුදල් හා බැංකු ශේෂය, 2024 වසරේ අප්‍රේල් මස 30 දිනට රුපියල් බිලියන 542.3 ක් අතිරික්තයක් ලෙස වර්ධනය වී ඇත.

**වගුව 2.17: රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ මෙහෙයුම් (ජනවාරි - අප්‍රේල් 2024)**

රු. බිලියන

| අයිතමය | ජනවාරි - අප්‍රේල් 2023 | 2024 | |
|---|---|---|---|
| | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -84.2 | 599.5 | 599.5 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 782.0 | 1,116.1 | 1,205.1 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -1,392.9 | -1,539.9 | -1,420.5 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -226.8 | -179.9 | -188.0 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -837.7 | -603.7 | -403.4 |
| දල ණය ගැනීම් භාවිතය * | 1,384.6 | 959.9 | 796.5 |
| ණය ආපසු ගෙවීම් | -474.8 | -269.9 | -444.4 |
| ශුද්ධ ණය ගැනීම් | 909.8 | 690.0 | 352.1 |
| පෙර වසරේ වාණිජ ණය ගැණීම් ශේෂය | 0.0 | - | - |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB /ශුද්ධ තැන්පතු යනාදිය) | 7.2 | - | -5.9 |
| **අවසාන මුදල් ශේෂය** | **-4.9** | **685.7** | **542.3** |

*මූලාශ්‍රය :භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2024 අප්‍රේල් 30 දිනට ගිණුම්ගත කරන ලද ව්‍යාපෘති / වැඩසටහන් ණය ඇතුලත් වේ.*

## 2.5 රාජ්‍ය ණය කළමනාකරණය

2024 වසර තුළ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ බැංකු ප්‍රාග්ධනීකරණය ක්‍රියාත්මක කිරීම සඳහා කරන ලද ප්‍රතිපාදන ද ඇතුළුව, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු දළ ණය ගැනීමේ සීමාව, රු. බිලියන 7,350 කි.

2024 වසරේ ජනවාරි මස 01 වනදා සිට අප්‍රේල් මස 30 වනදා දක්වා කාලය තුළ රජයේ ණය ගැනීම් රුපියල් බිලියන 796.5 කි. මෙම කාලය තුළදී ණය සේවාකරණය හා සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා දේශීය ණය ගැනීම් හා විදේශීය වැඩසටහන් /ව්‍යාපෘති ණය ගැනීම් වශයෙන් පිළිවෙලින් රු. බිලියන 734.2 ක සහ රු. බිලියන 62.3 ක මුළු ණය ලබාගෙන ඇත.

2024 වසරේ පළමු මාස හතර තුළ ආසන්න වශයෙන් සියයට 92.2 ක් දේශීය ණය ගැනීම්වලින් සමන්විත විය. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර දේශීය ණය ගැනීමේ ප්‍රධාන ප්‍රභවයන් විය. ඒ අනුව 2024 වසරේ පළමු මාස හතර තුළ සමස්ත දේශීය ණයවලින් සියයට 98.5 ක් පමණ භාණ්ඩාගාර බැඳුම්කර මගින් ලබාගෙන ඇති අතර සියයට 1.5 ක් භාණ්ඩාගාර බිල්පත් මගින් ලබාගෙන ඇත. කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් මත මුදල් පිටතට ගලා යාම හිලව් කිරීමෙන් පසු භාණ්ඩාගාර බිල්පත් ශුද්ධ වටිනාකමින් සටහන් කර ඇත.

**වගුව 2:18 දේශීය දළ ණය ගැනීම් (2024 ජනවාරි -අප්‍රේල්)**

| | රු. බිලියන |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 723.4 |
| භාණ්ඩාගාර බිල්පත් | 10.9 |
| **එකතුව** | **734.3** |

### භාණ්ඩාගාර ඇපකර මත අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම

2024 වසරේ අප්‍රේල් මස 30 වන දිනට නිකුත්කල හා එදිනට පවතින භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම රු. බිලියන 2,228.2 ක් වන අතර එය 2016 අංක 13 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතේ දෙවන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී. 2024 වසරේ අප්‍රේල් මස 30 වන දිනට මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව වගු අංක 2.19 හි දක්වා ඇත.

වගුව 2.19 2024.04.30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුව

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 1 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 121,104.00 | |
| | | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 15,138.00 | 136,242.00 |
| 2 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | ලංකා බැංකුව හා මහජන බැංකුව | 54,496.80 | 54,496.80 |
| 3 | ලංකා බැංකුව | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 500.00 | |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 4,540.00 | |
| | | ලංකා ධීවර සංස්ථාව | 250.00 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 100,000.00 | |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 835.00 | |
| | | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 200.00 | |
| | | සීමාසහිත ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම | 49,500.00 | |
| | | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය | 8,600.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 65,695.85 | |
| | | සීමාසහිත නෝර්ත් සී ආයතනය | 38.63 | |
| | | වී අලෙවි මණ්ඩලය | 374.50 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 147,102.33 | |
| | | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 93.00 | |
| | | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 1,513.80 | |
| | | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | 1,126.81 | |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,400.00 | 382,769.92 |
| 4 | චීන සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 49,958.61 | 49,958.61 |
| 5 | චයිනා නැෂනල් කෙමිකල් ඉංජිනියරින් නො. 14 කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ් | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 13,253.32 | 13,253.32 |
| 6 | කොමර්ෂල් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 968.36 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 4,755.93 | 5,724.29 |
| 7 | ඩී. බී. ට්‍රස්ටීස් හොංකොං ලිමිටඩ් | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 52,983.00 | 52,983.00 |
| 8 | ඩී.එෆ්.සී.සී. බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,026.24 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 5,896.51 | 11,922.75 |
| 9 | චීන එක්සිම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 26,841.19 | 26,841.19 |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 10 | ඉන්දියා එක්සිම් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 77,718.49 | 77,718.49 |
| 11 | හැටන් නැෂනල් බැංකුව | සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 4,000.00 | |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 3,725.21 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 15,146.76 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 20,133.15 | 43,005.13 |
| 12 | හොංකොන් ඇන්ඩ් ෂැංග්හයි බැංකුව | සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 13,363.21 | 13,363.21 |
| 13 | චීනයේ කර්මාන්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 12,707.56 | 12,707.56 |
| 14 | අයි. එන්. ජී. බෑන්ක්, එන්. වී. ඔෆ් නෙදර්ලන්ඩ්ස් | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 27,025.72 | 27,025.72 |
| 15 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) | සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 144,412.02 | 144,412.02 |
| 16 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 21,380.43 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 6,299.21 | 27,679.63 |
| 17 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 5,000.00 | |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 40,229.29 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 114,415.66 | |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව | 3,500.00 | |
| | | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 750.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 | 199,375.56 |
| 18 | මහජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 15,333.33 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2,338.82 | |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 21,771.61 | |
| | | සීමාසහිත ලංකා සතොස | 2,241.00 | |
| | | ජාතික කඩදාසි සංස්ථාව | 140.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 7,048.13 | |
| | | වී අලෙවි මණ්ඩලය | 760.75 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 56,916.46 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 100.00 | |
| | | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 14,335.02 | |
| | | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 1,165.00 | |
| | | ටෙකනෝ පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 750.00 | 122,900.12 |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු. මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 19 | සම්පත් බැංකුව පී. එල්. සී. | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 | 14,500.00 |
| 20 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3,633.12 | 3,633.12 |
| 21 | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | සීමාසහිත නෝර්ත් සී ආයතනය | 60.00 | 60.00 |
| 22 | යුනික්‍රෙඩිට් බෑංක් ඔස්ට්‍රියා AG | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 16,485.47 | 16,485.47 |
| 23 | ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 3,512.02 | 3,512.02 |
| 24 | ඉන්දියානු සංචිත බැංකුව | ශ්‍රී ලංකා මහ බැංකුව | 787,608.95 | 787,608.95 |
| | මුළු එකතුව | | **2,228,178.88** | **2,228,178.88** |

*මූලාශ්‍රය :භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

# 3 වන පරිච්ඡේදය

# රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය

### 3.1 සමාලෝචනය

2022 වර්ෂයේදී පිරිවැය පිළිබිඹු කරන විදුලි ගාස්තු ගැලපීම හඳුන්වා දීම, ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම, තෝරාගත් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු රජය විසින් ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය මෙන්ම රුපියලේ අගය අතිප්‍රමාණය වීම හේතුවෙන්, 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ රාජ්‍ය ව්‍යවසාය අංශය අඛණ්ඩව ශක්තිමත් කාර්යසාධනයක් වාර්තා කළේය. ඒ අනුව, ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 විසින් 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. බිලියන 144ක සමස්ත ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 185.9ක සමස්ත ලාභයක් වාර්තා කළේය.

සමස්ත යහපාලන ව්‍යුහය වැඩිදියුණු කිරීම, මිලෙහි විනිවිදභාවය ඇති කිරීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම හා මධ්‍ය හා දිගුකාලීන රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීම ඇතුළුව විදුලිබල ක්ෂේත්‍රයේ පුළුල් අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත 2024 වර්ෂයේ ජූනි මස 6 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. ඒ අතර, ආර්. එම්. පාර්ක්ස් සමාගම විසින් සිය මෙහෙයුම් කටයුතු 2024 වර්ෂයේ මැයි මස 8 වන දින ඛනිජතෙල් සිල්ලර වෙළඳපොළ තුළ ආරම්භ කරන ලදී. මෙමගින් ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සිල්ලර වෙළඳපොළේ තරඟකාරිත්වය වැඩි වනු ඇති අතර, පාරිභෝගික යහපත උදෙසා සේවා ප්‍රමිතීන් වැඩිදියුණු වනු ඇත.

2024 වර්ෂයේ අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් රජය සතු බැංකු සඳහා යහපාලනය, අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණයන් අනුමත කරන ලදී. 2024 වර්ෂයේ නොවැම්බර් මාසය අවසන් වන විට, අධ්‍යක්ෂකවරුන් 9ට නොඅඩු හා 13ට නොවැඩි සංඛ්‍යාවක් දක්වා වැඩි කිරීම, ඉන් බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් වීම, ස්වාධීන අධ්‍යක්ෂකවරුන් තෝරාගැනීම සඳහා විනිවිදභාවයකින් යුතු නව ක්‍රියාපරිපාටියක් හඳුන්වා දීම, ස්වාධීන අධ්‍යක්ෂකවරුන් සඳහා වෙළඳපොළ තරඟකාරී මට්ටමේ පාරිශ්‍රමිකයක් ගෙවීම, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ රාජ්‍ය බැංකු අධීක්ෂණය සඳහා විශේෂිත ඒකකයක් පිහිටුවීම, රාජ්‍ය බැංකු අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම වැනි කරුණු මෙම ප්‍රතිසංස්කරණ තුළ ඇතුළත් වේ. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ශේෂ පත්‍රය තවදුරටත් ශක්තිමත් කර එමගින් ආයෝජකයකු සුරක්ෂිත කිරීම සඳහා, 2024 වර්ෂයේ මාර්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් සමාගමේ ඇමෙරිකානු ඩොලර් මිලියන 210ක හා රු. බිලියන 31.4ක (ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 100කට සමාන අගයක්) භාණ්ඩාගාර ඇපකර සහිත ණය රජයේ ශේෂ පත්‍රයට පවරාගැනීමට අනුමැතිය ලබා දෙන ලද අතර, එමගින් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීම අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ අයබදු සහ ලාභාංශ එකතු කිරීම රු. බිලියන 9.6ක් වූ අතර, එය 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 13.2ක් දක්වා වැඩි වී ඇත.

### 3.2 රජය සතු ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

#### ලංකා බැංකුව

2023 වර්ෂය අවසන් වන විට රු. බිලියන 4,412ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2024 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 4,281ක් දක්වා සියයට 3.0කින් පහළ ගොස් ඇත. 2023 වර්ෂය අවසානය වන විට රු. බිලියන 3,882ක් වූ ලංකා බැංකුවේ තැන්පතු ප්‍රමාණය 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 3,744ක් දක්වා සියයට 3.6කින් පහළ ගොස් ඇත. 2023 වර්ෂය අවසානය වන විට සියයට 5.07ක් වූ අදියර III ණය අනුපාතය, 2024 අප්‍රේල් මස අවසානය වන විට සියයට 5.89ක් දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක් වී ඇත. 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ ලංකා බැංකුව රු. බිලියන 10.5ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර එය 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා කළ රු. බිලියන 3.4ක බදු පෙර ලාභය හා සැසඳීමේදී සැලකිය යුතු වැඩිවීමකි.

#### මහජන බැංකුව

2023 වර්ෂය අවසන් වන විට රු. බිලියන 3,038ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2024 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 3,129ක් දක්වා සියයට 3.0කින් වර්ධනය වී ඇත. 2023 වර්ෂය අවසානය වන විට රු. බිලියන 2,653ක් වූ තැන්පතු ප්‍රමාණය 2024 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 2,740ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. 2023 වර්ෂය අවසානය වන විට පැවති රු. බිලියන 1,709ක් වූ ණය කළඹේ වටිනාකම 2024 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 1,744ක් දක්වා සියයට 2.0කින් ඉහළ ගොස් ඇත. 2023 වර්ෂය අවසානය වන විට සියයට 4.7ක් වූ අදියර III ණය අනුපාතය 2024 අප්‍රේල් මස අවසානය වන විට සියයට 4.6ක් දක්වා සුළු වශයෙන් වැඩි දියුණු වී ඇත. 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 6.3ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ මහජන

බැංකුවේ බදු පෙර ලාභය සියයට 47.6යි. රු. බිලියන 9.3ක් දක්වා වැඩි වී ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2023 වර්ෂය අවසන් වන විට රු. බිලියන 1,687ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2024 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 1,681ක් දක්වා ආන්තික පහළ යාමක් වාර්තා කර ඇත. 2023 වර්ෂය අවසානය වන විට රු. බිලියන 1,483ක් වූ තැන්පතු පදනම 2024 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 1,493ක් දක්වා සියයට 0.6කින් වර්ධනය වී ඇත. එසේම, 2023 වර්ෂය අවසාන වන විට පැවති රු. බිලියන 527ක් වූ ණය සහ අත්තිකාරම් ශේෂය 2024 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 516ක් දක්වා සියයට 2.1කින් පහළ ගොස් ඇත. 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. මිලියන 332ක් වූ බදු පෙර අලාභය හා සසඳන විට 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. මිලියන 8,851ක් ලෙස වාර්තා කර ඇත.

### සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්ත (සංශෝධන) පනතේ දක්වා ඇති රෙගුලාසි හා අනුකූලව, 2023 වර්ෂය අවසන් වන විට සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ජීවිත හා සාමාන්‍ය මෙහෙයුම් එහි පූර්ණ පරිපාලිත සමාගම් වන සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සංස්ථාව හා සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සංස්ථාව වෙත වෙන් කිරීමේ කටයුතු අවසන් කර ඇත.

2024 වර්ෂයෙහි පළමු මාස හතර තුළ සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සංස්ථාව රු. මිලියන 8,697ක බදු පෙර ලාභයක් වාර්තා කරන ලද අතර, සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සංස්ථාව රු. මිලියන 1,116ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තියට අනුව සුදුසුකම් සඳහා ඉල්ලීම් කැඳවීමෙන් අනතුරුව සමාගමෙහි රජය සතු කොටස් අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, ලංසුකරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ කටයුතු අවසන් කිරීමට නියමිතව ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලය

පිරිවැය පිළිබිඹු වන මිල ක්‍රමය හඳුන්වා දීම හා 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ විදුලිබලය සඳහා වූ ඉල්ලුම 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී ගිගාවොට් පැය 4,516 සිට ගිගාවොට් පැය 4,937ක් දක්වා සියයට 9කින් වැඩිවීම මූලිකව හේතු කොටගෙන 2023 වර්ෂයේ පළමු මාස හතර හා සැසඳීමේදී 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ විදුලි අලෙවියෙන් උපයාගත් ආදායම රු. බිලියන 180.1 සිට රු. බිලියන 216.9ක් දක්වා සියයට 20කින් ඉහළ ගොස් ඇත. 2023 වර්ෂයේ සිදුවූ රුපියල අතිප්‍රමාණය වීම හා පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් 2023 වර්ෂයේ පළමු මාස හතර හා සැසඳීමේදී 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ ඍජු උත්පාදන පිරිවැය රු. බිලියන 160.2 සිට රු. බිලියන 113.4ක් දක්වා සියයට 29කින් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා විදුලිබල මණ්ඩලයේ (ලං.වි.ම) 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා කළ රු. බිලියන 8.6ක දළ අලාභයට සාපේක්ෂව 2024 පළමු මාස හතර තුළ රු. බිලියන 68.9ක දළ ලාභයක් වාර්තා කර ඇත. 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 29.8ක් වූ ශුද්ධ අලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා ලංවිමහි පරිපාලිත සමාගමක් වන ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් හි කොටස් විකිණීමෙන් ලද රු. බිලියන 26ක ලාභයත් සමඟ රු. බිලියන 90.7ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

2023 වර්ෂයේ පළමු මාස හතර තුළ උත්පාදන සංයුතිය තාප (ගල් අඟුරු)ඃ ජලඃ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති, සුළං සහ වහළමත සවිකල සූර්ය බලශක්තියඃ තාප (ඉන්ධන) සියයට 40:24:15:21 ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා 36:30:15:18 වශයෙන් වාසිදායක ලෙස වෙනස් වී ඇත. ඒ අනුව, විකුණුම් ස්ථානයේ ඒකකයක පිරිවැය ද 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ පැවති කි.වො. පැයට රු. 47.44ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා කි.වො. පැයට රු. 32.37ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති ගැනුම්කරුවන් සඳහා 2023 වර්ෂය අවසන් වන විට ගෙවිය යුතුව පැවති රු. බිලියන 79.2ක් වූ සමස්ත හිඟ මුදල් 2024 වර්ෂයේ අප්‍රේල් අවසානය වනවිට සියයට 67කින් රු. බිලියන 26.8ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත. තවද, 2023 වර්ෂය අවසන් වන විට රු. බිලියන 263.6ක් වූ නොගෙවූ ණය ප්‍රමාණය 2024 අප්‍රේල් අවසානය වන විට සියයට 1.2කින් රු. බිලියන 260.4ක් දක්වා අඩු වී ඇත.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ගෝලීය වෙළඳපොළේ 2023 වර්ෂයේ දෙසැම්බර් මස දී ඇමෙරිකානු ඩොලර් 77ක් ව පැවති බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2024 අප්‍රේල් අවසානය වන විට ඇමෙරිකානු ඩොලර් 89ක් දක්වා වැඩි විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 828.4ක් ව පැවති ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන වියදම 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 648.71ක් වී ඇත.

නව තරඟකරුවන් වෙළඳපොළට ඇතුළු වීම හේතුවෙන් තෙල් ප්‍රමාණය පහත වැටීම මත ආනයන පිරිවැය අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ විකුණුම් පිරිවැය වූ රු. බිලියන 390.1ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ විකුණුම් පිරිවැය රු. බිලියන 337.4ක් දක්වා සියයට 13.5කින් අඩු වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ පිරිවැටුම වූ රු. බිලියන 466.8ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ පිරිවැටුම රු. බිලියන 389.1ක් දක්වා සියයට 16.6කින් සැලකියයුතු ලෙස අඩු වී ඇත. එබැවින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 43.4ක් වූ ලාභය, 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.6ක් දක්වා සියයට 68.7කින් විශාල ලෙස අඩු වී ඇත.

මිල සූත්‍රය යළි හඳුන්වාදීම ඇතුළු බලශක්ති ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති හේතුවෙන් 2023 වර්ෂයේ සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිය ලාභය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ 2023 වර්ෂයේ අවසානය වන විට පැවති රු. බිලියන 181.2ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු බැරකම් 2024 වර්ෂයේ අප්‍රේල් අවසානය වන විට රු. බිලියන 153ක් දක්වා සියයට 15.6කින් පහළ ගොස් ඇත. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුව වෙත ගෙවිය යුතු කිසිදු හිඟ ශේෂයක් තවදුරටත් නොමැති අතර, ජාතික ඉරාන තෙල් සමාගමට ගෙවිය යුතු වටිනාකමද 2024 වර්ෂයේ අප්‍රේල් මස අවසන් වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 201ක් දක්වා අඩු වී ඇත.

### සී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම

පසුගිය කාලය පුරාවට ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූල්‍ය සීමාවන්ගේ ඇතිවූ බලපෑම මෙහෙයුම්වලට සිදු කල බාධාවන් තුළින් පැහැදිලිවම ප්‍රකාශ වී ඇත. රාජ්‍ය මූල්‍ය සීමාවන් හේතුකොටගෙන අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා ගුවන් සමාගමේ හිමිකම් ප්‍රාග්ධනයට දායක වීම රජයට තවදුරටත් සිදු කළ නොහැකිය. මෙම තත්ත්වය තුළ, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූල්‍ය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහාය වීම සඳහා සහ ආයෝජකයන්ගෙන් අරමුදල් අලුතින් සපයා ගැනීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගමේ කොටස් අයිතිය බැහැර කිරීමට රජය තීරණය කළේය. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අයිතිය බැහැර කිරීමේ ගනුදෙනුව සඳහා උපදේශන සේවා සැපයීමේ වගකීම ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව වෙත පවරා ඇත. 2023 ඔක්තෝම්බර් මාසයේදී ලංසු කැඳවීම නැතහොත් සුදුසුකම් සඳහා ඉල්ලීම් නිකුත් කරන ලද අතර, කිහිප වතාවක් දීර්ඝ කර 2024 අප්‍රේල් 22 දින ලංසු කැඳවීම අවසන් කර ඇත. ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි අධික ණය බර හේතුවෙන් ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතාවය සැලකිල්ලට ගනිමින් භාණ්ඩාගාර ඇපකර මත වූ ඇමරිකානු ඩොලර් මිලියන 310ක ණය රජයට මාරු කිරීමට තීරණය කළේය. ඒ අනුව, විභව ආයෝජකයින් හය දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද සුදුසුකම් සඳහා ඉල්ලීම් මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී.

ජාතික ගුවන් සේවය සුරක්ෂිත කිරීමේ අරමුණින් 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ එහි පවතින මුදල් ප්‍රවාහ ගැටලුවලට පිළියම් කිරීම වෙනුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත රු. බිලියන 5 ක ප්‍රාග්ධනයක් රජය විසින් ලබාදෙන ලදී.

අභියෝගාත්මක බාහිර හා අභ්‍යන්තර අරමුදල් බාධා මධ්‍යයේ වුවද ශ්‍රීලංකන් ගුවන් සමාගම 2023/24 මූල්‍ය වර්ෂයේදී උපයන ලද සමස්ත ආදායම රු. බිලියන 333.6 ක් වූ අතර, එය 2022/23 වර්ෂයේදී සමස්ත ආදායම වූ රු. බිලියන 365.2ට සාපේක්ෂව සියයට 8.6ක අඩු වීමකි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් 2022/23 වර්ෂයේදී රු. බිලියන 25.6ක් වූ විනිමය අලාභය 2023/24 වර්ෂයේදී රු. බිලියන 0.5ක විනිමය ලාභයක් ලෙස පරිවර්තනය වීම හේතුවෙන් 2022/23 මූල්‍ය වර්ෂයේදී රු. බිලියන 73.3ක් වූ බදු පෙර අලාභය 2023/24 වර්ෂයේදී රු. බිලියන 7.3ක බදු පෙර ලාභයක් ලෙස වාර්තා කරන ලදී.

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2023 වර්ෂයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කළ නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙලින් සියයට 60.7 සහ සියයට 96.4ක් වූ අතර, එයට සාපේක්ෂව 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙළින් සියයට 62.0ක් සහ සියයට 97.7ක් දක්වා ඉහළ නැංවීමට සමත් වී ඇත.

2024 වර්ෂයේ පළමු මාස හතර තුළදී, සමස්තයක් ලෙස සම්බන්ධතා මිලියන 3.06කට ළඟාවෙමින් නව ජල සම්බන්ධතා 60,000ක් පද්ධතියට එක් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් වී ඇත. ජලය සඳහා නව ගාස්තුවක් ක්‍රියාත්මක කිරීමත් සමඟ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 28.5ක ආදායමක් වාර්තා කර ඇති අතර, එය 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ ආදායම වූ රු. බිලියන 16.6ට සාපේක්ෂව සියයට 71.7ක වර්ධනයකි. එසේම, විදුලි ගාස්තු සහ අනෙකුත් ද්‍රව්‍ය පිරිවැය ඉහළ යාමත් සමඟ, විකුණුම් පිරිවැය 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 9.2ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 10.1ක් දක්වා සියයට 9.8කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පසුගිය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කර ඇති රු. බිලියන 7.4ක දළ ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ රු. බිලියන 18.3ක දළ ලාභයක් වාර්තා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2023 වර්ෂයේ පළමු මාස හතර තුළදී වාර්තා කළ රු. බිලියන 2.8ක ලාභයට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 10.1ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ නිෂ්පාදනය කළ ජලය ඝන මීටර් මිලියන 263ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ජලය ඝන මීටර් මිලියන 276ක් නිෂ්පාදනය කර ඇති අතර, 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ සිදු කළ ඝන මීටර් මිලියන 196ක ජල අලෙවියට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ ජල අලෙවිය ඝන මීටර් මිලියන

208කි. තවද, ආදායම් නොලබන ජලය, පෙර වර්ෂයට වඩා අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, පෙර වර්ෂය තුළදී සියයට 25.4 ක් වූ එම අගය සමලෝචිත කාලපරිච්ඡේදය තුළදී සියයට 24.4ක් ලෙස වාර්තා කර ඇත.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ජාත්‍යන්තර සහ සමුද්‍රීය වෙළඳ ක්ෂේත්‍රය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවනු ලබන කාර්යබහුලම වරාය වන කොළඹ වරාය, වඩාත් කැපී පෙනෙන මෙහෙයුම්කරුවෙකි. බටහිර කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය සහ නැගෙනහිර බහාලුම් පර්යන්තය වැනි වත්මන් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති තුළින් නවීන තාක්ෂණය භාවිත කිරීම මගින් මෙහෙයුම් සඳහා පවතින බාධාවන් ඉවත් කිරීම සහ මධ්‍ය කාලීනව දර්ශක ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වීමක් අපේක්ෂා කෙරේ.

2024 වර්ෂයේ පළමු මාස හතර තුළ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2023 සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව බහාලුම් ධාරිතාවන්හි සියයට 35ක වර්ධනයක් ළඟා කර ගෙන ඇත. රතු මුහුදේ අර්බුදය සහ එහි ප්‍රතිවිපාක ඇතුළු විවිධ සාධක හේතුවෙන් 2023 වර්ෂයේ පළමු මාස හතර තුළ මෙහෙයවන ලද අඩි විස්සේ බහාලුම් ඒකක 619,934ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ අධිකාරිය විසින් මෙහෙයවන ලද අඩි විස්සේ බහාලුම් ඒකක සංඛ්‍යාව 837,052ක් දක්වා වැඩි වී ඇත. 2024 වර්ෂයේ පළමු මාස හතර තුළදී වරාය අධිකාරියෙහි ප්‍රතිනැව්ගත කිරීමේ ධාරිතාව අඩි විස්සේ බහාලුම් ඒකක 748,813ක් දක්වා ළඟා වී ඇති අතර, එය 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 36ක වර්ධනයක් පෙන්නුම් කරයි. කොළඹ වරායෙහි සමස්ත ප්‍රතිනැව්ගත කිරීමේ ධාරිතාව, 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ අඩි විස්සේ බහාලුම් ඒකක 2,275,207ක් දක්වා ඉහළ නැංවීමට ඉහත වර්ධනය දායක වී ඇති අතර, 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව එය සියයට 20ක වැඩි වීමකි.

2024 වර්ෂයේ පළමු මාස හතර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත මෙහෙයුම් ආදායම රු. බිලියන 25.4ක් දක්වා වැඩි වූ අතර, එයින් සියයට 45ක් හෙවත් රු. බිලියන 11.6ක් නැව් භාණ්ඩ වාහක ආදායමින් ද, සියයට 27ක් හෙවත් රු. බිලියන 6.8ක් නාවික ආදායමින් ද, සියයට 12ක් හෙවත් රු. බිලියන 3.0ක් වාප්පු මෙහෙයුම් වලින් ද උපයාගෙන ඇත.

2023 වර්ෂයේ පළමු මාස හතර තුළ පැවති රු. බිලියන 12.1ට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ අධිකාරිය විසින් රු. බිලියන 13.7ක දළ ලාභයක් වාර්තා කර ඇත. 2024 වර්ෂයේ ජනවාරි සිට සාමූහික ගිවිසුම සංශෝධනය කිරීමෙන් සිදුවූ වැටුප් පිරිවැය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොට 2023 වර්ෂයේ පළමු මාස හතරෙහි පැවති පරිපාලන වියදමට සාපේක්ෂව 2024 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා වන පරිපාලන වියදම රු. බිලියන 4.0ක් දක්වා සියයට 34.5කින් වැඩි වී ඇත. මෙහෙයුම් ආදායමෙහි සිදු වූ වර්ධනය හේතුවෙන් 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ වරාය අධිකාරියෙහි බදු පෙර ලාභය රු. බිලියන 13.6ක් දක්වා සියයට 18.1කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර, 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ පැවති බදු පෙර ලාභය රු. බිලියන 11.5කි.

## ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

රජයේ විදෙස් ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ තීරණයත් සමඟ 2022 දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2 වැනි පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අතරමග නතර කළ අතර, ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ කළමනාකාරීත්වය ජපන් කොන්ත්‍රාත්කරු විසින් අර්ධ වශයෙන් නිම කරන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු අවසන් කිරීමට සැලැස්මක් සකස් කරන ලදී. ඒ අනුව, දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ඉතිරි වැඩ නිම කිරීම, මූලික ව්‍යාපෘතිය සඳහා පත් කළ උපදේශකවරයාගේ සෘජු අධීක්ෂණය යටතේම ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ අරමුදල් භාවිතා කරමින් සිදුකිරීම මෙම සැලැස්මට ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපළේ පවතින ධාරිතාව දැනටමත් ඉක්මවා ඇති බැවින් මෙම ව්‍යාපෘතිය නිම කිරීම ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ ඉදිරි පැවැත්මට ඉතා වැදගත් වේ.

2024 වර්ෂයේ පළමු මාස හතර තුළ ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ මුළු ආදායම රු. මිලියන 14,543ක් වූ අතර එය ගගනගාමී ආදායම වන රු. මිලියන 2,697කින්, ගගනගාමී නොවන ආදායම වන රු. මිලියන 11,794කින් සහ අනෙකුත් ආදායම රු. මිලියන 51කින් සමන්විතය. 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ මුළු වියදම රු. මිලියන 8,405ක් ලෙස වාර්තා වූ අතර, මුළු වියදමෙන් සියයට 55ක් රු. මිලියන 4,642ක පුද්ගල වියදම් වලින්ද, සියයට 25ක් ක්ෂය වියදම් වලින්ද සමන්විත වේ. ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම 2024 වර්ෂයේ පළමු මාස හතර තුළ බදු වලට පෙර ලාභය ලෙස රු. මිලියන 12,049ක් වාර්තා කළ අතර, එය 2023 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. මිලියන 11,624ට සාපේක්ෂව සියයට 3.6ක වැඩිවීමකි.

2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ක්‍රියාත්මක වූ ගුවන් ගමන් පාලකවරුන්ගේ වැටුප් පරිමාණයන් වැඩිවීමට සමගාමීව, මහා භාණ්ඩාගාරය විසින් 2024 වර්ෂයේදී ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහාද වැටුප් වැඩිවීමක් අනුමත කරන ලදී.

### වගුව 3.1 : රජය සතු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්වල ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර

| ආයතනය | ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර |
|---|---|
| රාජ්‍ය බැංකු | • ණය කළඹේ සමස්ත ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ සුපරීක්ෂණය සහ නැවත අයකරගැනීම වර්ධනය කිරීම.<br>• කාලීන නියාමන අවශ්‍යතා සමග යාවත්කාලීන වීම, අත්‍යවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සහ පාරදෘශ්‍ය වාර්තාකරණ භාවිතයන් පවත්වාගෙන යාම.<br>• මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් තාක්ෂණ හා අනුගතවීම, පාරිභෝගික සේවා මට්ටම ඉහළ නැංවීම සහ පාරිභෝගිකයන් වෙත ලඟාවීම ඉහළ නැංවීම.<br>• පවත්නා ගනුදෙනුකරුවන් වෙත සහය දීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව නිෂ්පාදිත සංවර්ධනය කිරීම.<br>• වරප්‍රසාද නොලත් ප්‍රජාව වෙත මූල්‍ය සේවා ලබාදීම පුළුල් කිරීම හා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම.<br>• වෙළඳපොළ තුළ රාජ්‍ය බැංකු වඩාත් තරඟකාරී තත්ත්වයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පාලන සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම. |
| සී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම | • අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සුදුසුකම් සඳහා යෝජනා ඉල්ලුම් කිරීම.<br>• අමාත්‍ය මණ්ඩලය විසින් භාණ්ඩාගාර ඇපකර නිකුත්කර තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 310ක ණය වගකීම් ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පවරා ගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.<br>• කාරක ප්‍රාග්ධන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත රු. බිලියන 5ක හිමිකම් ප්‍රාග්ධනයක් ලබාදෙන ලදී. |
| ලංකා විදුලිබල මණ්ඩලය | • ලංකා විදුලිබල මණ්ඩලයෙහි උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම යන අංශ වෙන් කිරීම තුළින් එම අංශ අතර ස්වාධීනත්වයක් හා විනිවිදභාවයක් තහවුරු කිරීම අපේක්ෂා කරමින් ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත 2024 ජුනි මස 6 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | • කාර්යය සාධන දර්ශක ලඟාකර ගැනීමේ කොන්දේසි වලට යටත්ව ඉදිරි වසර තුන වෙනුවෙන් අධිකාරියේ සේවකයන් සඳහා වන සාමූහික ගිවිසුම අනුමත කර අත්සන් කිරීම. |
| සී/ස ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | • වැටුප් විෂමතා විසඳීම සඳහා 2024 වර්ෂයේදී ගුවන් ගමන් පාලකවරුන් හැර අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා වෙනම වැටුප් ව්‍යුහයක් අනුමත කිරීම.<br>• සංචාරක ව්‍යාපාරයේ පුළුල් වන ඉල්ලුම සපුරාලීම සඳහා සහ ගුවන් තොටුපළේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවකයන් බඳවා ගැනීම අනුමත කිරීම. |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායන් හා රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව*

### වගුව 3.2: ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායිත්වය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යාපාර | 2022 | 2023 (අ) | 2024.04.30 (අ) |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 30,977 | 40,342 | 10,504 |
| 2 | මහජන බැංකුව | 21,338 | 15,345 | 9,268 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,510 | 6,117 | 8,851 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු | -89 | -1,043 | 41 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 303 | 2,465 | 94* |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 359 | 1,388 | – 412 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 43,428 | 64,959 | 5,433 |
| 8 | සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 23,494 | 29,272 | 1,659 *** |
| 9 | ජාතික රක්ෂණ භාර අරමුදල | 8,530 | 12,547 | 6,214 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 711 | 1,056 | 320 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 2,651 | 1,043 | 282 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -298,189 | 61,236 | 90,724 |
| 13 | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | -617,588 | 120,346 | 13,639 |

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යාපාර | 2022 | 2023 (ආ) | 2024.04.30 (ආ) |
|---|---|---|---|---|
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 57,027 | 40,359 | 13,566 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | – 2,701 | 5,286 | 10,162 |
| 16 | සීමා සහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රීලංකා) (පුද්ගලික) සමාගම | 6,434 | 33,640 | 12,049 |
| 17 | සීමා සහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම (අ) | -73,264 | 1,124 | 795** |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 1,421 | 2,189 | -996 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,269 | -2,458 | -235* |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 69 | 748 | 60 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 27 | -579 | 3 |
| 22 | සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | -392 | – 216 | -250 |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 133 | -122 | -147 |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 19 | -92 | 6 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 20 | -156 | 14 |
| 26 | සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම | 511 | 534 | 89 |
| 27 | සීමා සහිත හලාවත වැවිලි සමාගම | 514 | 303 | 91 |
| 28 | සීමා සහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | 346 | 94 | 46 |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 17 | -5 | 3 |
| 30 | සීමා සහිත ලංකා ඛනිජ වැලි සමාගම | 6,160 | 4,050 | -232 |
| 31 | සීමා සහිත ලංකා පොස්පේට් සමාගම (අ) | 61 | 347 | 167 |
| 32 | සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 57 | 38 | 13 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 3,267 | 3,516 | 1,421 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,390 | 844 | 502 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,586 | 2,522 | 718 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | -26 | 218 | 193 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | -2,285 | 1,272 | 659 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 247 | 304 | 386 |
| 39 | සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -370 | -205 | -4 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -541 | -342 | -29 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -235 | -532 | 7 |
| 42 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | -99 | 65 | 58 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 1,016 | 1,274 | 135 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (අ) | 735 | 901 | 527 |
| 45 | සීමා සහිත ලංකා සතොස සමාගම | -687 | 115 | 202 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -380 | 2,794 | – 210 |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -193 | 4 | 0.1 |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | 364 | 637 | 43 |
| 49 | සීමා සහිත ලංකා පොහොර සමාගම (අ) | 113 | 61 | 37 |
| 50 | සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම (අ) | 501 | 162 | 42 |
| 51 | සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම | -633 | -784 | -71 |
| 52 | සීමා සහිත ලංකා සීනි සමාගම | 6,045 | 2,828 | -576 |
| | **එකතුව** | **-774,560** | **455,811** | **185,861** |

*මූලාශ්‍රය : රාජ්‍ය ව්‍යවසායයන්*

*(අ) මාර්තු 31න් අවසන් මූල්‍ය වර්ෂය-(එනම්,2023; 2023/24 සඳහා )*

*(ආ) තාවකාලික*

**2024 ජන -මාර්තු*

***2024 අප්‍රේල්*

****පරිපාලක සමාගමේ ලාභය පමණකි .*

වගුව 3.3: රාජ්‍ය ව්‍යාපාර වෙතින් ලද අයබදු / ලාභාංශ ආදායම

රු. මිලියන

| | 2022 | 2023 | 2024.04.30 දිනට |
|---|---|---|---|
| අයබදු | **22,004** | **60,497** | **11,379** |
| මහජන බැංකුව | 441 | – | – |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | – | 5,000 | 5,000 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම | 13,200 | 23,000 | 2,000 |
| රාජ්‍ය දැව සංස්ථාව | 320 | 641 | – |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 100 | 300 | – |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 1,608 | 2,000 | 730 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 1,000 | 2,000 | 768 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 35 | 390 | – |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 416 | 533 | – |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 361 | 1,000 | 200 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 10 | 40 | 13 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 50 | 620 | 35 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | – | 500 | 500 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 1,000 | 4,000 | – |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 350 | – | 100 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 290 | 150 | 700 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 1,200 | 7,000 | – |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 10 | 300 | 200 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | – | 75 | – |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | – | 500 | – |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 1,015 | 8,066 | – |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 400 | 646 | 687 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | – | 75 | – |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | – | 350 | – |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 50 | 200 | – |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | 33 | 115 | 85 |
| පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය | 90 | 25 | 4 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 25 | 2,971 | 357 |
| ලාභාංශ | **6,087** | **15,204** | **1,856** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 30 | – |
| ලංකා  බැංකුව | 346 | 173 | – |
| මහජන බැංකුව | 316 | 158 | – |
| ජාතික සංවර්ධන බැංකුව | 1 | – | 2 |
| සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,511 | 2,272 | – |
| සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 500 | 5,500 | – |
| සීමා සහිත ලංකා ඛණිජ වැලි සමාගම | 759 | 2,500 | – |
| සීමා සහිත ලංකා පොස්පේට් සමාගම | 20 | 220 | – |
| සීමා සහිත ලංකා ලේලන්ඩ් සමාගම | 13 | 6 | – |
| සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | – | 125 | 75 |

රු. මිලියන

| | 2022 | 2023 | 2024.04.30 දිනට |
|---|---|---|---|
| සීමා සහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම) | – | 120 | – |
| සීමා සහිත ලංකා පොහොර සමාගම | 15 | 22 | – |
| සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | 60 | – |
| සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගම | 50 | 305 | 49 |
| සීමා සහිත රජයේ වාණිජ නීතිගත සංස්ථාව | 11 | 150 | – |
| සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 1,805 | 223 | – |
| සීමා සහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 313 | – | 1,324 |
| සීමා සහිත ලංකා විදුලිබල සමාගම | 218 | 697 | – |
| සීමා සහිත ලංකා කාර්මික වතු සමාගම | – | 174 | – |
| සීමා සහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 24 | 167 | 119 |
| වැවිලි සමාගම් | 95 | 554 | 287 |
| සීමා සහිත ලංකා සීනි සමාගම | – | 1,597 | – |
| ලංකා ත්‍රිපෝෂ සමාගම | 10 | 75 | – |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 10 | 75 | – |
| **එකතුව** | **28,091** | **75,701** | **13,236** |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 4 වන පරිච්ඡේදය

## විදේශ මූල්‍යනය

### 4.1 සමාලෝචනය

රජයේ මුදල් ප්‍රවාහ මෙහෙයුම් සඳහා සැලකිය යුතු සහනයක් සලසමින්, ශ්‍රී ලංකාව 2024 වසරේ ජූනි මස 26 වැනි දින එහි ද්විපාර්ශ්වික විදේශ ණයහිමියන් සමඟ අවසාන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්වලට එළඹුණි. ඒ අනුව, නිල ණයහිමියන්ගේ කමිටුවේ සාමාජිකයින් සහ චීනයේ එක්සිම් බැංකුව සමඟ ගිවිසුම්වලට එළඹුණි. 2023 වසරේ දී දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් ඇතුළු වාණිජ ණයහිමියන් සමඟ නුදුරු අනාගතයේ දී ගිවිසුමකට එළඹීමට රජය අපේක්ෂා කරන අතර, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා මේ වන විට සිදු වෙමින් පවතී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය 2024 වසරේ ජූනි මස 12 දින අවසන් කරන ලද අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවට ඇ.ඩො. මිලියන 336 ක තුන්වන වාරිකය ලැබීමත් සමඟ, 2023 වසරේ මාර්තු මාසයේ සිට මේ දක්වා ලබා දී ඇති මුළු මූල්‍ය පහසුකම් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 1 ඉක්මවයි. තවද, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු අනෙකුත් බහුපාර්ශ්වික ආයතනවලින් ශ්‍රී ලංකාවට ස්ථාවර ප්‍රතිපත්තිමය සහායක් ලැබෙන අතර ජපානය, ඕස්ට්‍රේලියාව ඇතුළු රටවලින් නිල සංවර්ධන සහය ලැබේ.

### 4.2 විදේශ මූල්‍යන එකඟතා

ශ්‍රී ලංකා රජය 2024 වසරේ පළමු මාස හතර තුළ දී විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 8 ක් මගින් ඇ.ඩො. මිලියන 296.8 ක එකඟතා ඇතිකරගෙන ඇති අතර, එයින් ඇ.ඩො. මිලියන 250.0 ක් ණය එකඟතා වේ. මෙම ණය ගිවිසුම් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසාය මූල්‍ය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ඇ.ඩො. මිලියන 100.0 කින් හා මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනයෙන් ලද ඇ.ඩො. මිලියන 150.0 කින් සමන්විත වේ.

ණය ගිවිසුම්වලට අමතරව, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී ජපානය හා ඕස්ට්‍රේලියාව යන විදේශ සංවර්ධන පාර්ශවකරුවන් සමග නිල සංවර්ධන ප්‍රදාන එකඟතා ගිවිසුම් 6 ක් මගින් ඇ. ඩො. මිලියන 46.8 ක එකඟතා ඇතිකරගෙන ඇත.

2024 වසරේ පළමු මාස හතර තුළ දී මානුෂීය ආධාර අංශය සඳහා ඉහළම විදේශ මූල්‍යන එකඟතා ලැබී ඇති අතර, එය ඇ.ඩො. මිලියන 150.0 ක් හෙවත් සමස්ත විදේශ මූල්‍යයන එකඟතාවලින් සියයට 51 ක් විය.

### 4.3 විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2024 වසරේ ජනවාරි මස 1 දින සිට අප්‍රේල් මස 30 දින දක්වා, ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.ඩො. මිලියන 160.4 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ.ඩො. මිලියන 152.7 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ.ඩො. මිලියන 7.7 ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

2024 වසර තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ලෝක බැංකුව සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව ලබාගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 41 ක් ද, අනතුරුව ඉහළම ප්‍රමාණ පිළිවෙලින් ආසියානු සංවර්ධන බැංකුව (සියයට 40) සහ ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව (සියයට 10) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

මෙම ප්‍රතිලබ්ධිවලින් සියයට 18 කට ආසන්න ඉහළම ප්‍රමාණය මාර්ග හා පාලම් අංශය සඳහා උපයෝජනය කර ඇති අතර, අනතුරුව පිළිවෙලින් ජලසම්පාදන හා සනීපාරක්ෂක අංශයේ ව්‍යාපෘති සඳහා සියයට 17 ක්ද, වාරිමාර්ග අංශයේ ව්‍යාපෘති සඳහා සියයට 12 ක්ද, ප්‍රවාහන අංශයේ ව්‍යාපෘති සඳහා සියයට 12 ක්ද උපයෝජනය කර ඇත.

වගුව 4.1: එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2024 වසරේ ජනවාරි මස 1 දින සිට අප්‍රේල් මස 30 දින දක්වා සිදු කරන ලද ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)


| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **3.4** | **1.3** | **4.7** |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල | 2.5 | - | 2.5 |
| නෙදර්ලන්තය | 0.8 | | 0.8 |
| ජපානය | - | 1.3 | 1.3 |
| **බහුපාර්ශ්වික** | **149.3** | **6.4** | **155.7** |
| ලෝක බැංකුව | 61.1 | 6.0 | 67.1 |
| ආසියානු සංවර්ධන බැංකුව | 64.8 | 0.4 | 65.2 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 15.9 | - | 15.9 |
| ඔපෙක් අරමුදල | 5.9 | - | 5.9 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 1.6 | - | 1.6 |
| **එකතුව** | **152.7** | **7.7** | **160.4** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඇ..ඩො බවට හැරවීමේදී එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*


** තාවකාලික අගයයන්*

රූප සටහන 4.1: 2024 වසරේ ජනවාරි මස 1 දින සිට අප්‍රේල් මස 30 දින දක්වා ප්‍රතිලබ්ධි - සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො. මිලියන)




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

රූපසටහන 4.2: 2024 වසරේ ජනවාරි මස 1 දින සිට අප්‍රේල් මස 30 දින දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි - ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඩො. මිලියන)




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*** වෙනත් - අධ්‍යාපනය සහ පුහුණුව, ධීවර , සෞඛ්‍යය හා සමාජ සුබසාධනය, මානුෂීය ආධාර, ඉඩම් සංවර්ධනය, වැවිලි, විදුලිය සහ බලශක්ති, ග්‍රාමීය සංවර්ධනය, විද්‍යා සහ තාක්ෂණය,*


### 4.4 එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය[1]

දැනට පළ කර ඇති එකඟතා අනුව විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වෙනුවෙන් උපයෝජනය කිරීමට නියමිත විදේශ මූල්‍යනවල ශේෂය 2024 අප්‍රේල් 30 දින වනවිට ඇ.ඩො. බිලියන 5.8 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ජපානය, ආසියානු සංවර්ධන බැංකුව ඉන්දියාව සහ ලෝක බැංකුව විසින් ලබා දීමට නියමිතය.

එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යන ශේෂයෙන් සියයට 21 ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 15 ක ප්‍රමාණයක් ජල සම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 11 ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද වේ.


(1) ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය අනුව බලපෑමට ලක්විය.

**රූප සටහන 4.3: 2024 වසරේ අප්‍රේල් මස 30 දින වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය - එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො. මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
* තාවකාලික
**වෙනත් = ඔස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, කුවේට්, පාකිස්ථානය, කොරියාව, රුසියාව, ජර්මනිය, ඩෙන්මාර්කය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, යුරෝපීය ආයෝජන බැංකුව, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල

**රූප සටහන 4.4: 2024 වසරේ අප්‍රේල් මස 30 දින වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය* - ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඩො. මිලියන)**




* තාවකාලික
මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

### 4.5 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2024 වසරේ අප්‍රේල් මස 30 දින වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යානයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය[1] ප්‍රමාණය ඇ.ඩො. බිලියන 36.9 කි.

2024 ජනවාරි 1 දින සිට අප්‍රේල් 30 දින දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 248.7 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 137.6 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 111.1 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින සිට අන්තර්කාලීන වශයෙන් තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස 12 දින සිට 2024 වසරේ අප්‍රේල් මස 30 දින දක්වා නොපියවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩො. මිලියන 6,020 ක්ද, පොලී ප්‍රමාණය[3] ඇ.ඩො. මිලියන 2,586 ක් ද විය.

---

[1] තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළුව ඇති මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.
භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරයන්හි විදේශ ආයෝජන ඇතුළත් නොවේ.
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණය එහි හිමිකාරිත්වයේ නේවාසික/ අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැත.

[2] ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම

[3] ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණයහිමියා සමඟ සැසඳීමට යටත්වේ.

# වසර මැද

# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

# 2024

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,

ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව